









# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT 2013

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை

**National Child Protection Authority**

**කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය**

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு

**Ministry of Women & Child Affairs**

# වාර්ෂික වාර්තාව

# 2013

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## දැක්ම

ළමුන් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම

## මෙහෙවර

ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් නිදහස් බව තහවුරු කිරීම



## ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍ය ගරු තිස්ස කරල්ලියද්ද මැතිතුමාගේ පණිවිඩය

ළමා ආරක්ෂාව, රැකවරණය හා සංවර්ධනය උදෙසා මහගු මෙහෙයක් සිදු කරනු ලබන, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2013 වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩයක් නිකුත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

වත්මන් සංකීර්ණ සමාජය තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම මහත් අභියෝගාත්මක ක්‍රියාවලියකි. එහිදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ඇප කැපවී මැනවින් එම කාර්යභාරය ඉටුකර ඇති බව, මෙම වාර්තාව අධ්‍යයනය කිරීම තුළින් පැහැදිලි වේ.

තම අධිකාරිය වෙත පැවරී ඇති වගකීම් හා කාර්යභාරයන් නොඅඩුව ඉටු කිරීම සඳහා මෙතෙක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පුරප්පාඩුව පැවති ප්‍රාදේශිය ළමා ආරක්ෂක නිළධාරින් වශයෙන් උපාධිධාරින් 360 දෙනෙක් බඳවා ගැනීමට පියවර ගෙන තිබීම සතුටට කරුණකි.

එමෙන්ම වත්මන් සමාජය තුළ සැගව පවත්නා ළමා අපයෝජන තත්වයන් මෙන්ම ළමා අපයෝජන සම්බන්ධ වගකිවයුත්තන් නීතියේ රැහැනට හසුකර ගැනීමට කටයුතු කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් විවිධ සමාජ ස්ථරයන් අධ්‍යයනයන් කරමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් මෙම වසර තුළදීත් සිදුකිරීම අගය කළ යුත්තකි.

දරුවන්ගේ ආරක්ෂාව හා රැකවරණය වෙනුවෙන් දැනට පවතින වැඩසටහන් තව තවත් අර්ථවත් හා ප්‍රායෝගික අයුරින් ක්‍රියාත්මක කරමින්, වසරින් වසර නැවුම් වැඩසටහන් හඳුන්වාදෙමින්, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ඉටුකරනු ලබන ජාතික වගකිම අගය කළ යුතුය.

එමෙන්ම විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මා හට පැවරී ඇති වගකීම සහ මඟපෙන්වීම නොපිරිහෙලා ඉටුකිරීමට කටයුතු කරන බව මා මෙහිලා ප්‍රකාශ කරීමට කැමැත්තෙමි. ඒ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් මා හට ලබා දෙන සහයෝගය අගය කරන අතර, සුරක්ෂිත දරු පරපුරක් දැයට දයාද කිරීම වෙනුවෙන්ම අපමණ වෙහෙස වී කටයුතු කරන ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමිය ඇතුලු සමස්ත කාර්ය මණ්ඩලය එම කටයුතු ඉතා සාර්ථකව කරනු ඇතැයි මම විශ්වාස කරමි.

**2014.12.20**

**තිස්ස කරල්ලියද්ද (පා.ම.)**

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍ය

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය



# ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2013 වාර්ෂික වාර්තාව වෙත පණිවිඩයක් නිකුත් කරන්නේ ඉතාමත්ම සතුටිනි.

දැයේ දරුවන් උදෙසා සියලු අපයෝජනයන්ගෙන් තොර සමාජ සංස්කෘතියක් ගොඩ නැගීම අප සියලු දෙනාගේම වගකීමකි. එම වගකීම ඉටු කිරීමේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සිය කාර්යභාරය නිසි අයුරින් ඉටු කරන අතර, බිම් මට්ටමේ සිට ක්‍රියාත්මක වැඩසටහන් ගණනාවක පුරෝගාමී මෙහෙවරක යෙදෙන්නටද ජාතික ළමා ආරක්ෂක අධිකාරියට හැකිවීම මම ඉතාමත් අගය කරමි.

විශේෂයෙන් රටක ළමා ආරක්ෂාව තහවුරු කිරීම අභියෝගාත්මක කර්තව්‍යයකි. කිසියම් අපයෝජනයකට ලක්වන වින්දිත දරුවන් සමාජය වෙත නැවත ප්‍රවිශ්ටවීමේදී සමාජ අපගාමී චර්යාවන්ට ගොදුරුවීමේ ඉඩකඩ බහුලවේ. මෙය අවමකර ගැනීමට වින්දිතවන ළමයින් විධිමත් ලෙස සමාජගත කිරීමට අවශ්‍ය උපදේශනය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරයි.

පැය 24 පුරා භාෂා 03න්ම ක්‍රියාත්මක 1929 ශ්‍රී ලංකා ළමා දුරකථනය සේවය තුළින් ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි ඉතාමත් කඩිනමින් ලබා ගනිමින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරන විශේෂ කාර්යභාරයකි.

2013 වර්ෂයේදී "ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය" එළිදැක්වීමට ද, ආයතනගත ළමයින්ගේ උපරිම යහපත තහවුරු කිරීම වෙනුවෙන් "ළමා රැකවරණ මධ්‍යස්ථාන සඳහා වූ මඟ පෙන්වීම් හා ප්‍රමිතීන්" ඇතුළත් කෙටුම්පත එළි දැක්වීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 2013 වර්ෂයේදී හැකි විය. එය දැයේ දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ගත් තීරණාත්මක සාධකයක් ලෙස සඳහන් කළ යුතුමය.

දැයේ සියලුම දරුවන් සුරක්ෂිත කිරීමේ භාරධූර වගකීම ඉතා කැපවීමෙන් සිදු කිරීමට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය ද දැඩි වගකීමෙන් සහයෝගය ලබාදෙන අතර, ඒ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමිය ඇතුළු කාර්ය මණ්ඩලය වෙත චිත්ත ධෛර්ය සහ ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**2014.12.10**

**එරික් ඉලයප්ආරච්චි**

ලේකම්

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය



# ගරු සභාපතිතුමියගේ පණිවිඩය

රටක අනාගතය තීරණය කරනු ලබන ප්‍රබලතම හා තීරණාත්මකම සාධකය වන්නේ ළමයින්ය. වර්තමානයේ දී ශ්‍රී ලංකාව සංවර්ධනයේ හිණිපෙත්තටම ගමන් කරමින් සිටින අතර, ඊට සමගාමීව දැයේ දරුවන්ගේ ආරක්ෂාව ද තහවුරු කළයුතුය. එබැවින් ඔවුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීමට කටයුතු කරන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම ප්‍රබල අභියෝගයට මුහුණ දෙමින් 2013 වර්ෂයේදී නව වැඩසටහන් හඳුන්වාදෙමින් විධිමත්ව හා කාර්යක්ෂමව දැයේ දරුවන් ආරක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.

විශේෂයෙන් ශ්‍රී ලාංකික ළමා ආරක්ෂක ඉතිහාසයේ නව සංධිස්ථානයක් සනිටුහන් කරමින් 2013 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රාදේශිය ළමා ආරක්ෂක නිළධාරීන් 360 දෙනෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලදි. එම නිලධාරීන්ගෙන් 212 දෙනෙකු එම වර්ෂය තුළදීම බඳවාගැනීමට කටයුතු කරන ලදි. එමෙන්ම ළමා ආරක්ෂාවට අදාළව පර්යේෂණයන් කිහිපයක් සිදු කිරීමට ද මෙම වර්ෂය තුළදී අධිකාරියට හැකිවිය. ඒ අතර ජාවාරම්කරණයට එරෙහි නීති අකාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වීමට හේතු තහවුරු කර ගැනීම සඳහා වූ පර්යේෂණ අධ්‍යයනය සහ පාසල්වල සපයන උපදේශන සේවාවල ගුණාත්මක තත්ත්වය පිළිබඳ වූ පර්යේෂණ අධ්‍යයනය ප්‍රමුඛවේ. වින්දිත ළමයින්ගේ උපරිම යහපත වෙනුවෙන් "සුරැකි පියස" නම් ළමා සුරැකුම් මධ්‍යස්ථානයක් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පූර්ණ මැදිහත්වීම මත 2013 වර්ෂයේ දී ආරම්භ කරන ලදි. එමෙන්ම "ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තියේ කෙටුම්පත" එළිදැක්වීමට හැකිවීමද මෙම වර්ෂය තුළදී අප ලැබූ ජයග්‍රහණයකි. ආයතනගත ළමයින්ගේ උපරිම යහපත තහවුරු කිරීම වෙනුවෙන් "ළමා රැකවරණ මධ්‍යස්ථාන සඳහා වූ මඟ පෙන්වීම් හා ප්‍රමිතීන්" ඇතුළත් කෙටුම්පත ද එළි දැක්වීමට 2013 වර්ෂයේ දී කටයුතු කරන ලදි. 1939 අංක 48 දරණ ළමා හා යෞවන ආඥා පණත (CYPO) සංශෝධනය කිරීම සඳහා වූ නිර්දේශ, අදාල අංශ වෙත ඉදිරිපත් කිරීමට පියවර ගැනීමටද මෙම වර්ෂය තුළදී අපට හැකිවිය. එමෙන්ම 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය ළමා හිතකාමී ප්‍රවේශයක් තුළ ජනතාවට වඩාත් සමීපවෙමින් මෙම වසර තුළදී ක්‍රියාත්මක විය.

මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් "මල්වන් දරුවන්" යන සංකල්පයන්ට අනුගතව දැයේ දරුවන් වෙනුවෙන් ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් උරුමකරදීම සඳහා නිරන්තරයෙන්ම වෙහෙසෙමින් 2013 වර්ෂයේදීද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කර්තව්‍යන් සාර්ථක කර ගැනීම සඳහා නිරතුරුව ධෛර්ය සහ උපදෙස් ලබාදුන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට මාගේ ගෞරවය හා ස්තුතිය පුදකර සිටිමි. රටේ ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ කාර්යයේදී ළමා සංවර්ධන හා කාන්තා කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තිස්ස කරල්ලියද්ද මැතිතුමාගෙන් සහ එම අමාත්‍යාංශයේ ලේකම් එරික් ඉලයප්ආරච්චි මැතිතුමා ඇතුළු එම අමාත්‍යාංශයේ නිළධාරින් ගෙන් ලැබෙන සහය ද අතිශයින්ම අගය කරමි. එමෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ මූල මණ්ඩලයෙන් ද, අධිකාරියේ නියෝජ්‍ය සභාපති නීතිඥ සුජාතා කුලතුංග මහත්මිය ගෙන් ද ලැබෙන සහයද මම මෙහිදී කෘතවේදීව සිහිපත් කරමි. ළමයින් සම්බන්ධයෙන් ක්‍රියා කරන, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්ද අප වෙත දක්වන දායකත්වය ප්‍රසංසනීයවේ. එසේම බොහෝ ජනමාධ්‍ය ආයතනයන් කිසිඳු මූල්‍ය ගෙවීමකින් තොරව 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන අංකය ප්‍රචලිත කිරීම සඳහා ලබාදුන්නාවූ සහය ද අතිශයින්ම අගය කරන අතර, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහයෝගයද මම අගය කරමි.

සියළු අපයෝජනයන්ගෙන් තොරව ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමඟ ඒකරාශීවී ක්‍රියා කිරීමට ඔබ සැමට ආරාධනා කිරීමටද මම මෙය අවස්ථාවක් කර ගනිමි.

2014.10.20

**නීතිඥ අනෝමා දිසානායක**
සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය



# නියෝජ්‍ය සභාපතිතුමියගේ පණිවිඩය

නූතන සමාජයේ බරපතල සමාජ ප්‍රශ්නයක් වශයෙන් ව්‍යාප්ත වෙමින් පවතින ළමා අපයෝජන වළක්වා ගැනීම සඳහා ක්‍රියාත්මක වීමට කටයුතු කිරීම අප සැමගේ වගකීමක් මෙන්ම යුතුකමකි. එම වගකීම ඉටු කරනු වස් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2013 වර්ෂයේද දැයේ දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් විශාල කාර්යභාරයක් සිදු කරන ලදි.

ළමා අපයෝජන වළක්වා ගැනීමේ එක් ක්‍රමවේදයක් වන්නේ ළමා අපයෝජන සම්බන්ධයෙන් දැනුවත්වීමයි. මෙහිදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය බිම් මට්ටමේ සිට, දැයේ දරුවන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරනු වස් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. විශේෂයෙන් ළමයින් සමඟ සමීපව කටයුතු කරන රාජ්‍ය නිළධාරින් වන සෞඛ්‍ය වෘත්තිකයන්, විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීම තුළින් ළමා හිතකාමී පරිසරයක් ඇති කිරීම සඳහා ඇවැසි පරිසරය සකස් කරන ලදි. පාසල් ළමා ආරක්ෂක කමිටු යටතේ උපදේශන ගුරුවරුන් දැනුවත් කිරීම ද ඉතා ක්‍රමවත්ව මෙම වර්ෂයේදී සිදු කරන ලදි.

ළමා අපයෝජනයන්ට ලක්වූ වින්දිත ළමයින් වෙත රැකවරණය ලබාදීම සමාජය විසින් සිදු කළ යුතුම කටයුත්තකි. එහිදී විශේෂයෙන්ම ළමා අපයෝජන වාර්තා කිරීමේ මාධ්‍ය භාවිතය වඩාත් ඵලදායි මට්ටමක පැවතිය යුතුය. මේ සම්බන්ධයෙන් අප අධිකාරිය ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය සංවේදිකරණ වැඩමුළු පැවැත්වූ අතර,  එහිදී ජනමාධ්‍යවේදීන් සඳහා "මාර්ගෝපදේශ අත්පොතක්" නිකුත් කිරීමට හැකිවිය.

2005 අංක 16 දරණ සුනාමි (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානයන්ට අනුකූලව සුනාමි ව්‍යසනයට ගොදුරුවූ භාරකාරිත්වය අහිමි දරුවන් සඳහා කැපකරු භාරකාරිත්වය හා සුභසාධනය සැලසීම මෙම වසර තුළදී කඩිනම්ව සිදු කිරීමට හැකිවිය.

2013 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කර්තව්‍යයන් සාර්ථක කර ගැනීම සඳහා නිරතුරුව ධෛර්ය සහ උපදෙස් ලබාදුන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් එම කටයුතු සාර්ථක කර ගැනීමට අපව මෙහෙය වූ ළමා සංවර්ධන හා කාන්තා කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තිස්ස කරල්ලියද්ද මැතිතුමාටත්, එම අමාත්‍යාංශයේ ලේකම් එරික් ඉලයප්ආරච්චි මැතිතුමා සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය නිවැරදි මගකට මෙහෙයවමින් සිටින ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති නීතිඥ අනෝමා දිසානායක මැතිණියත් මම මෙහිදී කෘතවේදීත්වයෙන් සිහිපත් කර සිටිමි. එමෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ මූල මණ්ඩලයෙන් ලැබෙන සහයද මම මෙහිදී කෘතවේදීත්වයෙන් යුතුව සිහිපත් කර සිටින අතර, අධිකාරියේ කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහයෝගයද මම ඉතා අගය කරමි.

දැයේ දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පමණක් තනිව සිදු කළ නොහැකි බැවින්, සමස්ත සමාජයේම සෘජු දායකත්වය ලබාදෙමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමඟ අත්වැල් බැඳ ගන්නා ලෙසට ආරාධනා කරමි.

**2014.10.20**

**නීතිඥ සුජාතා කුලතුංග**

නියෝජ්‍ය සභාපති

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## 2013 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| නීතිඥ අනෝමා දිසානායක මහත්මිය | සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,<br>අංකඃ330, තලවතුගොඩ පාර,<br>මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර |
| නීතිඥ සුජාතා කුලතුංග මහත්මිය | නියෝජ්‍ය සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,<br>අංකඃ330, තලවතුගොඩ පාර,<br>මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර |
| මහාචාර්ය සමුද්‍රා කත්‍රිආරච්චි මහත්මිය | මනෝ වෛද්‍ය විශේෂඥ,<br>මනෝ වෛද්‍ය ඒකකය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,<br>නුගේගොඩ |
| මහාචාර්ය මනෝරි සේනානායක මහත්මිය | ජ්‍යෙෂ්ඨ ළමා රෝග විශේෂඥ,<br>වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය,<br>කොළඹ 07 |
| වෛද්‍ය පී. බී. දසනායක මහතා | අධිකරණ වෛද්‍ය නිළධාරි,<br>විෂ වේදය හා නීති වෛද්‍ය ආයතනය,<br>111, ෆ්‍රැන්සිස් පාර,<br>කොළඹ 10 |
| ආචාර්ය ටී. ස්වින්ද්‍රන් මහතා | මනෝවිද්‍යාඥ,<br>6, පෙරේරා මාවත<br>කොළඹ 10 |
| බී. පී. අලුවිහාරේ මහතා | නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්,<br>නීතිපති දෙපාර්තමේන්තුව,<br>කොළඹ 12 |
| එම්. යමුනා පෙරේරා මහත්මිය | කොමසාරිස්,<br>පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,<br>නො.69, එස්.එස් ජයසිංහ මාවත,<br>කොහුවල |
| පර්ල් වීරසිංහ මහත්මිය | කම්කරු කොමසාරිස් ජෙනරාල්,<br>කම්කරු දෙපාර්තමේන්තුව,<br>කොළඹ 05 |
| ආර්. කේ. ජී. ඩී. විජේසිංහ මහත්මිය | අධ්‍යක්ෂ,<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,<br>මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය,<br>මහ ලේකම් කාර්යාලය,<br>කොළඹ 01 |
| ශිරෝමි මාසකෝරාල මහත්මිය | සාමාජික,<br>4/10, වැලිකඩ වත්ත,<br>රාජගිරිය |
| බී. එම්. අබේකෝන් මහත්මිය | සාමාජික,<br>304, බෞද්ධාලෝක මාවත,<br>කොළඹ 07 |
| අශෝක විජේතිලක මහතා | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය,<br>කුරුණෑගල |

## 2013 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල මණ්ඩලය

| | |
|---|---|
| අනුෂා ඒ. මුනසිංහ මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>අධිකරණ අමාත්‍යාංශය,<br>කොළඹ 12 |
| ආර්. එම්. අයි. රත්නායක මහත්මිය | අතිරේක ලේකම්,<br>රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය,<br>බාලදක්ෂ මාවත,<br>කොළඹ 03 |
| කේ. ඩබ්. ටී. එන්. අමරතුංග මහත්මිය | අතිරේක ලේකම්,<br>ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය,<br>අංක.163, කිරුලපන මාවත,<br>පොල්හේන්ගොඩ,<br>කොළඹ 05 |
| එම්. ඒ. එම්. අරිෆා මහත්මිය | කොමසාරිස්,<br>කාන්තා හා ළමා කටයුතු අංශය,<br>කම්කරු දෙපාර්තමේන්තුව,<br>කොළඹ 05 |
| හේමා ධර්මවර්ධන මහත්මිය | අතිරේක ලේකම්,<br>ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,<br>නො. 464, ටී.බී. ජයා මාවත,<br>කොළඹ 10 |
| යූ. එස්. කේ. දෙනාවත්ත මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය,<br>අංක 330, යුනියන් පෙදෙස,<br>කොළඹ 02 |
| ඩී. එස්. විජේසේකර මහත්මිය | අතිරේක ලේකම්,<br>ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය,<br>නොඃ175, ඒ නාවල පාර,<br>නුගේගොඩ |
| කේ. වී. ඩී. සී. විමලසිරි මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන),<br>සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,<br>අංක.385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,<br>කොළඹ 10 |
| එම්. සී. එල්. ප්‍රනාන්දු මහතා | අතිරේක ලේකම්,<br>සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශය,<br>සෙත්සිරිපාය,<br>බත්තරමුල්ල |
| එච්. යූ ප්‍රේමතිලක මහතා | අතිරේක ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල |

| පටුන | පිටුව |
|---|---|


හැඳින්වීම .................................................................................................... 01

ළමයින් වෙනුවෙන් වූ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය .................... 02 - 03

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනු ඒකක .................................................... 03

දරුවන් වෙනුවෙන් අපි දීප ව්‍යාප්තවම ............................................................ 04

2013 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය ........................... 05

අපි හැමදේම කරන්නේ, දරුවන් ආරක්ෂා කරගන්න .............................................. 06

මල්වන් ළමා ජීවිත වනසන ප්‍රධාන ක්‍රම 4 යි ............................................... 07

අපයෝජකයාට දරුවාට සමීප වීමට ඉඩ නොදෙමු .....
ඔවුන්ගෙන් දරුවන් ආරක්ෂා කරගනිමු ............................................................ 08

සතුටින් පිරුණු ළමා ලොවක් වෙනුවෙන් වූ අපේ ක්‍රියාකාරකම් ............................... 09


## සංවර්ධන වැඩසටහන්


1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව ............................................................... 09 - 10

පාසල් ළමා ආරක්ෂක කමිටු .......................................................................... 11 - 13

සිවිල් සංවිධාන සාමාජිකයන් හා වතු ආශ්‍රිත ප්‍රජාව දැනුවත් කිරීම් ...................... 13 - 14

පොලිස් නිළධාරින් දැනුවත් කිරීම .................................................................. 15

සෞඛ්‍ය වෘත්තිකයන්ගේ හා අනුශාංගික සේවාවල නිරතවූවන්ගේ කුසලතා
සංවර්ධනය ............................................................................................. 15 - 16

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීම ....................................... 16 - 17

ගැබිණි මව්වරුන් දැනුවත් කිරීම .................................................................. 17 - 18

පාසල් සංවර්ධන සමිති ආශ්‍රිත දැනුවත් කිරීම .................................................. 18

දෙමාපියන් දැනුවත් කිරීම .......................................................................... 18 - 19

ළමයින් දැනුවත් කිරීම ................................................................................. 19

තරුණ කණ්ඩායම් දැනුවත් කිරීම .................................................................. 20

ළමා නිවාස අධීක්ෂණ වැඩසටහන .................................................................. 20 - 21

සුනාමි ව්‍යසනය හේතුකොට ගෙන වින්දිත වූ දරුවන් සඳහා පුනරුත්ථාපන
කටයුතු හා සුබසාධන කටයුතු සිදුකිරීම ......................................................... 22

සුරක්නා කැපකරු රැකවරණ ක්‍රමය ................................................................ 22 - 23

ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය සංවේදීකරණ වැඩමුළුව ........................................ 23

ළමා හිංසනයට එරෙහි ජාතික දිනය ............................................................... 23

ළමා ශ්‍රමිකත්වයට එරෙහි ලෝක දිනය ............................................................ 24

තොරතුරු ලබාදීම ........................................................................................ 24

ළමා ආරක්ෂාවට අදාල තොරතුරු ජනමාධ්‍ය හරහා ජනතාව අතරට රැගෙනයාම.. 25
ප්‍රදර්ශන හා ජංගම සේවා පැවැත්වීම .............................................................................. 25
ළබැඳි පුවත් හසුන .............................................................................................................. 26
සමස්ත ලංකා ළමා චිත්‍ර තරගය 2013 .............................................................................. 26
මනෝසමාජීය වැඩසටහන් .................................................................................................. 27
ප්‍රාදේශීය ළමා ආරක්ෂක හා මනෝසමාජීය නිලධාරින් බඳවා ගැනීම ...................... 27
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මඟින් ළමා ආරක්ෂාවට අදාලව විවිධ මාතෘකා ඔස්සේ අධ්‍යයන පැවැත්වීම ........................................................................................ 28
දිරිදරු සුරැකුම් පියස සම්පත් මධ්‍යස්ථාන ...................................................................... 28
ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන .................................................................................................. 29
සුරැකි පියස ළමා සුරැකුම් මධ්‍යස්ථානය ........................................................................ 29
ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තියේ කෙටුම්පත එළිදැක්වීම ....................................... 29 - 30
ළමා රැකවරණ මධ්‍යස්ථාන සඳහා වූ මඟපෙන්වීම් හා ප්‍රමිතීන් ඇතුළත් කෙටුම්පත එළිදැක්වීම .......................................................................................................... 30
1939 අංක 048 දරණ ළමා හා යෞවන ආඥා පණත සංශෝධනය පිළිබඳ ඉදිරි පියවර ගැනීම ............................................................................................................ 30
විශේෂ පොලිස් විමර්ශන .................................................................................................. 30 - 31
ළමා අපයෝජන වින්දිතයන්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම .................................. 31
ළමා අපයෝජන නඩු කටයුතු සඳහා ජාන පරික්ෂාව ....................................................... 31
නීතිමය කර්තව්‍යන් ............................................................................................................ 32
ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි ...................................................................................... 33

**වර්ෂය අවසන් ආදායම් හා වියදම් ප්‍රකාශනය** ............................................................ 34 - 36
**විගණන වාර්තා** .................................................................................................................. 37 - 45

## හැඳින්වීම

ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ලොව විවිධ සංවිධාන හා රාජ්‍යයන් ඒකරාශිවීමේ ප්‍රතිඵලයක් ලෙස, 1989 නොවැම්බර් 20 වන දින එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය විශ්ව ප්‍රකාශයක් ලෙස සම්මත විය. මෙම ප්‍රඥප්තිය වගන්ති 54 කින් සමන්විත වන අතර, එමඟින් විශ්ව ව්‍යාප්ත මට්ටමින් කිසිදු වෙනස්කමකින් තොරව සෑම ළමයෙකුටම හිමිවිය යුතු අයිතිවාසිකම් මෙන්ම එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍ය සතු බැඳියාව ද විග්‍රහ කර තිබේ. ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් පවතින සමාජ තත්ත්වය විමර්ශනය කිරීමේදී, සන්නද්ධ අරගල සඳහා ළමා ශ්‍රමය භාවිතා කිරීමත්, ළමා වෙළඳාම, ළමා ගණිකා වෘත්තිය සහ ළමුන් කාමුක චිත්‍රපට සහ ප්‍රකාශන සඳහා යොදා ගැනීම තුළින් ළමුන්ගේ සංවර්ධනයට විශාල වශයෙන් බලපාන බව දක්නට ලැබුණි. මෙහි ප්‍රතිඵලක් වශයෙන් වර්ෂ 2000 යේදී අතුරු කෙටුම්පත වශයෙන් ළමුන් සන්නද්ධ අරගලවලට බඳවා ගැනීම වැළැක්වීම සහ ළමා වෙළඳාම, ගණිකා වෘත්තිය සහ ළමයින් කාමුක චිත්‍රපට සඳහා යොදා ගැනීම වැළැක්වීම ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට ඇතුළත් කරන ලදි.

ලොව පැවැති මෙම ප්‍රවනතාවයන් සමඟ ලංකා රජයද එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සඳහා 1991 වසරේදී අත්සන් කොට තම එකඟතාවය පළ කරන ලදි. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ ළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සම්බන්ධයෙන් 1996 වසරේ දෙසැම්බර් මස ළමා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවනු ලැබීය. එහිදී කරුණු විමර්ශනය කළ එම කමිටුව ළමා අපයෝජන අවම කිරීම සඳහා අධිකාරි බලතල සහිත රාජ්‍ය ආයතනයක අවශ්‍යතාවය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපිත කරනු ලැබීය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ආරම්භයේ සිටම වර්තමානය දක්වාම ළමා අපයෝජන වළක්වා ගැනීම, ළමා අපයෝජනයන්හිදී ඊට අදාල නිසි පියවර ගැනීම හා වින්දිත දරුවන් යළි සමාජගත කිරීමට අදාල කටයුතු වෙනුවෙන් ක්‍රියා කරමින් සිටියි.

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ බලතල භාවිතා කරමින් දැයේ දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන අතර, 2004 දෙසැම්බර් මස 26 වැනි දින ඇතිවූ සුනාමි ව්‍යසනය හේතුවෙන් වින්දිත භාවයට පත් ළමුන්ගේ අභිවෘද්ධිය සඳහා 2005 අංක 16 දරණ සුනාමි (විශේෂ විධිවිධාන) පනත මඟින්ද අධිකාරිය වෙත බලතල හිමිව පවතියි. තවද 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩක්‍රියා වැළැක්වීමේ පනත මඟින් ළමයෙකු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වූ විට අධිකාරියට වාර්තාවීමේදී තෙවන පාර්ශවකරුවෙකු වශයෙන් ඊට මැදිහත් විය හැකිය.

ළමයින්ගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ළමා අපයෝජන සිදුවීම් කඩිනම්ව සහ විධිමත්ව වාර්තා කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2010 ජූලි 22 වන දින "1929" ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පැය 24 පුරාම ක්‍රියාත්මක කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරි පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදි. මෙම දුරකථන සේවාව ශ්‍රී ලංකා ළමා ආරක්ෂක ක්‍රමවේදයේ ඉතා වැදගත් සංධිස්ථානයක් බවට පත්වූ අතර, එය දකුණු ආසියානු රටවල පවතින වඩාත් වැදගත් ළමා දුරකථන සේවාවක් ලෙස ක්‍රියාත්මක කිරීමට හැකිවිය. මෙම දුරකථන සේවය ආරම්භයත් සමඟ සමාජයේ සැඟව පැවති ළමා අපයෝජන වාර්තාවීම දක්නට ලැබුණි. අද වන විට ලංකාවේ සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ළමා අපයෝජන වාර්තාවන අතර, උපදේශන සේවාවන්ද මෙමඟින් ලබාගත හැකිය. වර්තමානය වන විට මෙම දුරකථන සේවය ජනතාවට වඩාත් සමීප වෙමින් ක්‍රියාත්මක වෙයි.

## ළමයින් වෙනුවෙන් වූ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය

- ළමා අපචාර වැළැක්වීම සහ එවැනි අපචාරවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහිලා ආණ්ඩුවට උපදෙස් දීම.
- ළමා අපචාර වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- එවැනි අපචාරවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- අපචාරවලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳ සහ ළමා අපචාර වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.
- ළමා අපචාර වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපචාරවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැකගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියා මාර්ග ගැනීම සහ උචිත අවස්ථා වලදි එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිසා හා ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.
- ළමා අපචාර වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම.
- සියලු ආකාර ළමා අපචාරවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම.
- ළමා අපචාර හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.
- සන්නද්ධ ගැටුම්වල බලපෑම්වලට පාත්‍ර වූ ළමයින් සම්බන්ධව මානුෂිකව සැලකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව යොමුවීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම හා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුභසිද්ධිය සඳහා පියවර ඇතුළුව එවැනි ළමුන්ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුළුකර ගැනීම.
- අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා, අවශ්‍ය අවස්ථාවලදී උචිත පියවර ගැනීම.
- ළමා අපචාර පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදි ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීම.
- ළමා අපචාරවලට එරෙහිව කරනු ලබන දැඩි ව්‍යාපාර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපදෙස් දීම හා සහය වීම.
- ළමා අපචාර සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වාගෙන යාම.
- අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව නියාමනය කිරීම.
- ළමා අපචාර සහ ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

- ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම.
- ළමා අපචාරවලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම පිණිස, සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමඟ සංවාදයෙහි යෙදීම.
- ළමා අපචාර පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම.
- සියලු ආකාර ළමා අපචාර අනාවරණය කර ගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ ආණ්ඩු සහ අන්තර් ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනු ඒකක ........................


ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ  පහත අනු ඒකක ක්‍රියාත්මක වේ ළමා ආරක්ෂාව වෙනුවෙන් එම අනු ඒකක සුවිශේෂී කාර්යභාරයක් සිදු කරයි.

- පරිපාලන ඒකකය
- මූල්‍ය ඒකකය
- සැලසුම් හා තොරතුරු ඒකකය
  - පුස්තකාලය
- වැඩසටහන් ඒකකය
- මනෝසමාජීය ඒකකය
- නීති ඒකකය
- නීතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය
  - 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය
  - විමර්ශන ඒකකය
  - මධ්‍යම ලේඛනාගාරය
- අභ්‍යන්තර විගණන ඒකකය
- විශේෂ පොලිස් විමර්ශන ඒකකය
- ව්‍යාපෘති ඒකකය

## දරුවන් වෙනුවෙන් අපි දීප ව්‍යාප්තවම.........

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය දීපව්‍යාප්තව ඉටු කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් අධිකාරියේ නිළධාරීන් දෙදෙනෙකු සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් එක් නිළධාරියෙකු සේවය කරනු ලබයි. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ළමා ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය සියලු කටයුතු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලය හා එක්ව සිදු කිරීම මොවුන්ගේ ප්‍රධාන කාර්යභාර්යයයි.

## 2013 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය




## අපි හැමදේම කරන්නේ , දරුවන් ආරක්ෂා කරගන්න

ළමයින් සියලු ආකාරයේ අපයෝජනයන්ට ලක්වීම වලක්වමින් ළමයින්ට  සිදුවන එවැනි අපයෝජන ක්‍රියාවලට එරෙහිව ප්‍රතිචාර දැක්වීම ළමා ආරක්ෂාවයි. වැඩිහිටියන් විසින් ළමයින් වැරදි ක්‍රියාවලට යොදවා ගැනීම, ළමා අපයෝජනය ලෙස සරලවම අර්ථ දැක්විය හැකියි. මෙමඟින් ළමයාට සිදුවන හානිය සුලු පටු නොවේ. අපයෝජනය නිසා ළමයා තුළ,

- කම්පනයට පත්වීම
- බියෙන් මුසපත් වීම
- ආත්ම විශ්වාසය බිඳවැටීම
- අධ්‍යාපන කටයුතු බිඳවැටීම
- සුව නින්දක් නොමැති වීම
- අනාගතය පිළිබඳව සුභවාදීව නොදැකීම
- අයහපත් ක්‍රියාවන්ට යොමුවීම
- අපරාධකාරී ක්‍රියාවන්ට යොමුවීම
- වැඩිහිටියන්ගේ හැසිරීම් පෙන්වීම
- ලිංගිකත්වය පිළිබඳ අවබෝධය වයසට නොගැලපෙන අසාමාන්‍ය තත්වයක දක්නට ලැබීම

වැනි අපහසුකාරි තත්ත්වයන් ගණනාවක් දක්නට ලැබේ. දරුවන් මෙවැනි තත්ත්වයන්ට පත්වීම වලක්වාලීමට අප ඒකාවන්ව කටයුතු කළ යුතුයි.

## මල්වන් ළමා ජීවිත වනසන ප්‍රධාන ක්‍රම 4 යි




### ශාරීරික අපයෝජනය යනු

යමෙකු විසින් ළමයෙකුට හානි කිරීම හෝ හානිවිය හැකි යම් ශාරීරික ක්‍රියාවක් සිදු කිරීම.

### ලිංගික අපයෝජනය යනු

යම් පුද්ගලයකු විසින් ළමයෙකු ලිංගික ක්‍රියාකාරකමකට සම්බන්ධ කර ගැනීමයි.

### මානසික අපයෝජන යනු

ළමුන්ගේ මානසිකමය සංවර්ධනයට හානි ගෙනදෙන ක්‍රියාකාරකම් වේ.

### නොසලකා හැරීම යනු

ළමයාගේ දෙමාපියන් හෝ භාරකරුවන් විසින් ළමයාගේ මූලික අවශ්‍යතා පිළිබඳව සොයා නොබැලීමයි.

**අපයෝජකයාට දරුවාට සමීප වීමට ඉඩ නොදෙමු .....**
**ඔවුන්ගෙන් දරුවන් ආරක්ෂා කරගනිමු .......**

- ඔබ ළමුන් සමඟ විවෘතව සාකච්ඡා කරන්න
- දරුවන්ට දැනෙන්න ආදරය කරන්න
- දරුවන්ට හොඳින් සවන් දෙන්න
- දරුවාගේ දිනපතා ක්‍රියාකාරකම් හා චර්යාවන් පිළිබඳව මනා අවබෝධයක් ලබා ගන්න
- හොඳ සහ නරක ස්පර්ශයන් පිළිබඳව ළමුන් දැනුවත් කරන්න
- නරක ස්පර්ශයන් මඟින් ශරීරයට අපහසුතාවයක් සහ පීඩාවක් ඇතිවන බව ළමුන්ට පැහැදිලි කරන්න
- අනිසි බලපෑම් එල්ල කරන විට ඊට විරුද්ධ වීමට ළමයා හුරු කරන්න
- සමාජයේ ජීවත්වන පුද්ගලයන් විවිධ බවත් ඔවුන්ගෙන් ඕනෑම මොහොතක බලපෑම් එල්ල වියහැකි බවත් ළමයින්ට කියා දෙන්න
- කිසියම් අවස්ථාවක අනාරක්ෂිත බවක් දැනේ නම් වහාම එම ස්ථානයෙන් ඉවත්වීමට ළමයා හුරු කරන්න.
- අපයෝජකයන් මිතුරකු ලෙස පැමිණ තෑගි බෝග ලබාදී ළමයින් සමඟ සම්බන්ධතා ගොඩ නගා ගැනීමට උත්සහ දරන බව ඔවුන්ට කියා දෙන්න
- හුදකලා ස්ථානවල ගැවසීමෙන් වලකින ලෙස ළමයින්ව දැනුවත් කරන්න
- යමෙක් හිරිහැර කිරීමට උත්සහ දරයි නම් හඬනගා කෑගැසීමට හෝ දිවයන ලෙස ඔබගේ ළමුන්ට උපදෙස් දෙන්න
- ළමුන්ට එරෙහිව ප්‍රචන්ඩත්වය ඇති වන්නේ ඔහු හෝ ඇය තනියම සිටින විට බව ළමුන්ට පවසන්න
- ළමයාගේ මිතුරන් පිළිබඳව අවබෝධයක් ලබා ගන්න
- හැකි සෑම විටම ඔබේ ළමුන් පාසලට, උපකාරක පංතියට රැගෙන යාමට හා රැගෙන ඒමට ඔබම කටයුතු කරන්න
- සාමාන්‍ය පාසල් වේලාව සහ උපකාරක පංති වේලාව නිමවීමට පෙර අදාල ස්ථානයෙන් බැහැරව නොයන ලෙස ළමයාට පවසන්න
- සමීපතම පුද්ගලයින්ගෙන් වුවද ළමයින් අපයෝජනයට ලක්විය හැකි බව ඔවුන්ට පහදා දෙන්න
- ළමුන්ගේ අන්තර්ජාලය භාවිතය පිළිබඳව අධීක්ෂණය කරන්න

## සතුටින් පිරුණු ළමා ලොවක් වෙනුවෙන් වූ අපේ ක්‍රියාකාරකම්

සතුටින් පිරුණු ලොවක් ළමයින්ට උරුම කර දීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය දීප ව්‍යාප්තව වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරමින් සිටියි. එම වැඩසටහන් වල අරමුණ දැයේ දරුවන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරමින් ඔවුන්ට සුරක්ෂිත වටපිටාවක් උරුම කර දීමයි මාතෘ භූමියට, අපට කළ හැකි ලොකුම සේවය වන්නේ රටේ අනාගතය වූ දරුවන් ආරක්ෂා කොට ඔවුන්ට මනා පෞරුෂත්වයකින් හා ගෞරවයකින් යුතු ආඩම්බර විය හැකි ළමා වියක් උරුමකර දීම වන අතර, ඒ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2013 වර්ෂයේදි ක්‍රියාත්මක කළ වැඩසටහන් රැසකි.

## සංවර්ධන වැඩසටහන්

### 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව


"1929" යනු දැයේ දරුවන්ගේ උපරිම යහපත වෙනුවෙන් කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ඇති එකම ළමා දුරකතන සේවයයි. 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත මගින් ළමා අපයෝජනයට සම්බන්ධ මහජන පැමිණිලි භාරගැනීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කර්තව්‍යයක් ලෙස දක්වා ඇත. එකී කාර්යය වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායිව ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් 2010 වසරේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ ස්ථාපිත කරන ලද, ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය ළමා අපයෝජන සම්බන්ධ පැමිණිලි බාරගැනීමේ සහ ඒවාට කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ප්‍රමුඛතම යාන්ත්‍රණය ලෙස ක්‍රියාත්මක වෙමින් පවති. දවසේ පැය 24 පුරාම සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂාවන්ගෙන් ක්‍රියාත්මක වන මෙම දුරකථන සේවාව වෙත, ඕනෑම ජංගම හෝ ස්ථාවර දුරකථනයකින් නොමිලයේ ප්‍රවේශ වීමේ හැකියාව ඇත.

අන්තර්ජාතික ළමා දුරකථන සේවා සංගමයේ යාවජීව සාමාජිකත්වයද ලබාගනිමින්, දරුවන් මුහුණ දෙන අපයෝජන තත්ත්වයන් පිළිබඳ ළමා හිතකාමී ප්‍රවේශයක් ඔස්සේ කඩිනම් සහ ඵලදායී ප්‍රතිචාර දැක්වීම අරමුණු කොට කටයුතු කරනු ලබන මෙම සේවාව වෙත ඕනෑම දරුවකුට මෙන් ම වැඩිහිටියකුට ද ප්‍රවේශ වී තොරතුරු ලබාදීමේ හැකියාව පවතී. මේ වන විට දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි ළමයින් දෙමාපියන් සහ අනෙකුත් ප්‍රජාවන් වෙතින් පැමිණිලි ලැබෙමින් පවතින අතර, ඇතැම් සැඟවුණු ළමා අපයෝජනයන් පවා අනාවරණය කරගැනීමට එමඟින් අවකාශ සැලසී ඇත.

එසේම 1929 ආරම්භයත් සමග එම පැමිණිලි සම්බන්ධයෙන් ඉතා කඩිනමින් විමර්ශන කටයුතු සිදු කිරීම සඳහාවූ සුවිශේෂ යාන්ත්‍රණයක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ඉල්ලීම පරිදි පොලිස් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කර ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ඉල්ලීම පරිදි එවකට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික වත්මන් පොලිස්පතිතුමාගේ මැදිහත්වීම මත "1929 ළමා දුරකථන සේවය" වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මකවීම සම්බන්ධ උපදෙස් ලබාදෙමින් දිවයිනේ සියලු පොලිස් ස්ථාන වෙත පොලිස් දෙපාර්තමේන්තුව මඟින් අභ්‍යන්තර

චක්‍රලේඛයක් නිකුත් කරන ලදි. 1929 වෙත ලැබෙන පැමිණිලි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මඟින් අදාළ පොලිස් ස්ථානය වෙත යොමු කිරීමෙන් අනතුරුව එවැනි පැමිණිලි සම්බන්ධයෙන් වහාම විමර්ශනයක් සිදු කර පැය 48 ක් ඇතුළත ඒ පිළිබඳ ප්‍රගති වාර්තාවක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත සැපයිය යුතු බවට එමඟින් උපදෙස් ලබාදී ඇත. "1929 ළමා දුරකථන සේවය" ස්ථාපිතවීමත් සමඟ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබුණු අතිවිශාල පැමිණිලි සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා මෙකී සම්බන්ධීකරණය බෙහෙවින් ඉවහල් විය.

ළමා අපයෝජන සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට අදාල මෙවැනි ක්‍රමවත් හා ශක්තිමත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන අතරතුර වින්දිත දරුවන්ට අවශ්‍ය උපදේශනය ලබාදීම, පාසැල් ගත කිරීම, වින්දිත ළමයා නැවත සමාජ ගත කිරීම, අවධානම් කළමණාකරනය සඳහා අවශ්‍ය සහයන් ලබා දීම, නීති උපදෙස් ලබා දිම, ආදී අනෙකුත් සහයන්ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මඟින් සිදු කරනු ලබයි. විශේෂයෙන්ම වින්දිත දරුවන්ට අවශ්‍ය උපදේශනයද ඇතුළත් මනෝසමාජ සහය ලබාදීම කෙරෙහි ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ අවධානය යොමුව ඇත. දිවයින පුරා විසිරී සිටින දිස්ත්‍රික් මනෝ සමාජීය නිළධාරින් මඟින් වින්දිත දරුවන් උදෙසා අවශ්‍ය මනෝසමාජීය සහය ලබා දීමට කටයුතු කරනු ලබයි. එසේම වින්දිත දරුවන්ගේ රැකවරණය තහවුරු කිරීම සඳහා යථාතත්වයට පත්වීමට අවශ්‍ය සම්බන්ධීකරණය දිවයින පුරා විසිර සිටින, දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිළධාරීන් විසින් සිදු කරනු ලබයි. මෙම පැමිණිලි සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කිරීම නියාමනය කරමින්ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පසු විපරමෙහි නිරතව සිටි. 2013 වර්ෂයේදී 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවයට ලැබී ඇති ඇමතුම් සංඛ්‍යාව 30657 කි.




**2013 වර්ෂයේදී 1929 ශ්‍රී ලංකා ළමා දුරකතන සේවයට ලැබී ඇති ඇමතුම් සංඛ්‍යාව**



## පාසල් ළමා ආරක්ෂක කමිටු

පාසල ළමා ආරක්ෂාව සම්බන්ධ වෙනසක් කළ හැකි ස්ථානයක් ලෙස හඳුනාගත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අධ්‍යාපන අමාත්‍යංශය හා ඒකාබද්ධව දිවයින පුරා පාසල් වල "සුරකුම් පච්ච" නමින් පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ වැඩසටහනක් දියත් කර ඇත මෙය පාසලේදී මෙන්ම ඉන් පරිබාහිරව සිදුවන ළමා අපයෝජනයන් පිටු දැකීම සඳහාත්, ළමා හිතකාමී අධ්‍යාපන පරිසරයක් පාසල තුළ ඇති කිරීම සඳහාත්, සෑම විටකදීම ළමුන් අපයෝජනයන්ගෙන් ආරක්ෂා කර ගැනීමටත් සහ මනා පෞරුෂයෙන් හෙබි ළමා පිරිසක් බිහි කිරීම සඳහාත් යන ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආරම්භ කරන ලද වැඩසටහනකි. මේ සඳහා 2011 අංක 17 දරණ අධ්‍යාපන අමාත්‍යංශ චක්‍රලේකය නිකුත් කරනු ලැබූ අතර, මෙය ගුරු සිසු දෙමාපිය සම්බන්ධතාව ඔස්සේ ළමා ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධ උපාය මාර්ගික ප්‍රවේශයකි. මෙම වැඩසටහන තුළදී පහත කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමුකරනු ලබයි.

1. සියලු ආකාරයේ ළමා අපයෝජනයන්ගෙන් ළමුන් ආරක්ෂා කරගැනීම.
2. විවිධාකාරයේ අපයෝජනයන්ට ගොදුරුවී ඇති දරුවන් පාසල තුළ සිටී නම් ඉතා රහසිගත ලෙස හඳුනාගැනීමත්, එකී දරුවන්ට අවශ්‍ය රැකවරණය සහ ආරක්ෂාව සහතික කිරීමත්, නීතිය ක්‍රියාවට නැංවීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය දැනුවත් කිරීම.
3. අධ්‍යාපන කාර්යයේදී පසුගාමී දරුවන් පංති මට්ටමෙන් හඳුනාගැනීමත් ඊට බලපා ඇති සමාජ, ආර්ථික සාධක සහ පවුල් පසුබිම හඳුනා ගැනීම පිණිස කටයුතු කිරීම, අවශ්‍ය උපදේශනය ලබාදීම, පසුවිපරම් කටයුතු සහ සම්පත් ඌනතාව සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය යොමු කිරීම.
4. විශේෂ මානසික හෝ කායික අවශ්‍යතා සහිත දරුවන්ට උපකාර කිරීම.
5. දරුවන්ගේ මානසික ආතතිය අවම කිරීමට බලපාන නිර්මාණාත්මක සහ චිකිත්සක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. දරුවන්ගේ ප්‍රීතිමත් හැඟීම් සහ දුක්බදායී අත්දැකීම් ප්‍රකාශ කිරීම සහ හුවමාරු කිරීම සඳහා අවස්ථාවක් ලබාදීම.
7. දරුවන්, දෙමාපියන් සහ ගුරුවරුන් අතර සහසම්බන්ධතාව ඉහළ නැංවීම.
8. දරුවන්ට සවන්දීම.
9. දරුවන්ගේ ආරක්ෂාව සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සේවය සහ සම්බන්ධීකරණය නිරතුරුව ලබාදීම.
10. පාසල් දරුවන් දුම්පානය, මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය, ලිංගික අපචාර සහ අනෙකුත් දුෂ්චරියාවන්ට යොමුවීම වැළැක්වීම.
11. විනය ගරුක හැසිරීම් සම්බන්ධයෙන් පාසල් දරුවන්ට ඇති වගකීම අවබෝධ කරවීම සහ සුභවාදීව ඔවුන්ගේ පෞරුෂය ගොඩනැංවීම.
12. විනයගරුක ළමා හිතකාමී පාසල් පරිසරයක් නිර්මාණය කිරීම.
13. පූර්ණ පෞරුෂයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කිරීම.

2013 වර්ෂයේ ළමා ආරක්ෂක කමිටු වැඩසටහන යටතේ පාසල්වල උපදේශන ගුරුවරුන් 1,464 ක් පුහුණු කර ඇති අතර ත්‍රිකුණාමලය, මොණරාගල, අම්පාර, මාතලේ, මහනුවර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි විදුහල්පතිවරුන් 1,108 ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කර ඇත. එමෙන්ම මෙම වැඩසටහන යටතේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා ගුරුවරුන් (උපදේශන ගුරුවරුන් නොවන) 2689 ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.





පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටවීම යටතේ ක්‍රියාත්මක වන විශේෂ අංගයක් වනුයේ දරුවන්ගේ මානසික තත්ත්වයන් හදුනාගැනීමට හා ඔවුන්ට සහාය වීමට ඔවුන්ගේ ගැටළු සහ අදහස් සටහන්කර බහාලීම සඳහා "සිනහ කදුළු පෙට්ටිය" නම් තොරතුරු ලබා ගැනීමේ පෙට්ටියක් පාසල තුළ ස්ථාපිත කිරීමය.



**පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම යටතේ උපදේශන ගුරුවරුන් දැනුවත් කිරීම දිස්ත්‍රික්ක අනුව පහත පරිදි වේ.**

| **දිස්ත්‍රික්ක** | **උපදේශන ගුරුවරුන් ගණන** |
|---|---|
| කොළඹ | 69 |
| ගාල්ල | 68 |
| මාතර | 80 |
| හම්බන්තොට | 44 |
| මොණරාගල | 86 |
| බදුල්ල | 117 |
| මහනුවර | 75 |
| නුවරඑළිය | 62 |
| මාතලේ | 102 |
| අනුරාධපුරය | 74 |
| පොළොන්නරුව | 73 |
| රත්නපුර | 88 |
| කෑගල්ල | 101 |
| කුරුණෑගල | 162 |
| පුත්තලම | 91 |
| අම්පාර | 60 |
| මඩකලපුව | 66 |
| ත්‍රිකුණාමලය | 46 |
| ***මුළු එකතුව*** | ***1464*** |

## සිවිල් සංවිධාන සාමාජිකයන් හා වතු ආශ්‍රිත ප්‍රජාව දැනුවත් කිරීම්

අපයෝජනයන්ගෙන් තොර සුරක්ෂිත දරු පරපුරක් ගොඩනැගීම වෙනුවෙන් ප්‍රජාව සතු වගකීම අවබෝධ කරදෙමින් ඔවුන්ගේ දැනුම, ආකල්ප සහ කුසලතා සංවර්ධනය කිරීම උදෙසා, දීප ව්‍යාප්තව ග්‍රාමීය මට්ටමින් සිවිල් සංවිධාන සාමාජිකයින් හා වතු ආශ්‍රිත ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරයි. එහිදී සෑම දිස්ත්‍රික්කයක් තුළම ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක වන සමෘද්ධි සංගම්, කාන්තා සමිති, මරණාධාර සමිති, සුභසාධක සමිති ග්‍රාම සංවර්ධන සමිති යනාදී සිවිල් සංවිධානයන්හි සාමාජිකයින් හා වතු ආශ්‍රිත ප්‍රජාව දැනුවත් කිරීම සිදුකරයි. ග්‍රාමිය මට්ටමේදී හා වතුකරය තුළ සිදු වන ළමා අපයෝජන අවම කරමින් දරුවන්ට වඩාත් සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම මෙම වැඩසටහනෙහි ප්‍රමුඛ අරමුණු වේ.

**2013 වර්ෂයේදී සිවිල් සංවිධාන සාමාජිකයන් හා වතු ආශ්‍රිත ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයිනම ආවරණය වන පරිදි පැවැත්වූ අතර, එම වැඩසටහන් වල ප්‍රතිලාභින් සංඛ්‍යාව 14,988 කි.**

| දිස්ත්‍රික්ක | සිවිල් සංවිධාන සාමාජිකයන් දනුවත් කිරීම හා වත අශ්‍රිත දැනුවත් කරීම් |
|---|---|
| කොළඹ | 534 |
| ගම්පහ | 698 |
| කළුතර | 503 |
| ගාල්ල | 418 |
| මාතර | 791 |
| හම්බන්තොට | 1205 |
| මොණරාගල | 1170 |
| බදුල්ල | 1363 |
| මහනුවර | 1227 |
| නුවරඑළිය | 905 |
| මාතලේ | 198 |
| අනුරාධපුරය | 669 |
| පොළොන්නරුව | 234 |
| රත්නපුර | 1546 |
| කෑගල්ල | 974 |
| පුත්තලම | 413 |
| අම්පාර | 189 |
| වව්නියා | 594 |
| කිලිනොච්චිය | 901 |
| යාපනය | 231 |
| ත්‍රිකුණාමලය | 225 |
| ***මුලු එකතුව*** | ***14,988*** |

## පොලිස් නිළධාරීන් දැනුවත් කිරීම

අපයෝජන වලින් ළමයින් ආරක්ෂා කර ගැනීමේ කාර්යේදී පොලිස් නිළධාරීන් විසින් සිදුකරන්නේ සුවිශේෂී මෙහෙවරකි. ළමා අපයෝජනයකදී ඊට අදාලව නිසි පරිදි නීතිය ක්‍රියාත්මක කොට වින්දිත ළමයාට අවශ්‍ය නෛතික සහයත් ලබා දීම අත්‍යවශ්‍යය කරුණකි. මෙම කාර්යභාරයේදී පොලිස් දෙපාර්තමේන්තුව වෙත පැවරෙන්නේ සුවිශේෂි වගකීමකි. ඒ අනුව වින්දිත ළමයාගේ මුල් ප්‍රකාශ සටහන් කර ගැනීමේ සිට ඇරඹෙන සමස්ත යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළදීම ළමා හිතකාමී සහ වින්දිත ළමයාගේ අනන්‍යතාවය සුරකෙන ක්‍රමවේදයක් භාවිතා කිරීම අත්‍යාවශ්‍ය වේ.

මෙම කර්තව්‍යයේ වැදගත්කම හඳුනාගත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාවට නංවා ඇත. අපයෝජනයන්ට ගොදුරු වූ දරුවන් සහ අපයෝජන අවදානමක් ඇති දරුවන් සමඟ රාජකාරි සිදු කරන ආකාරය පිළිබඳ මෙන්ම නව නීති රීති සංශෝධනයක් පිළිබඳව ද දැනුවත් කිරීම මෙම වැඩසටහනෙහි අරමුණ විය. 2013 වසර තුළදීද පොලිස් නිලධාරින් දැනුවත් කිරිමේ වැඩසටහන් පවත්වන ලදි.



## සෞඛ්‍ය වෘත්තිකයන්ගේ හා අනුශාංගික සේවාවල නිරතවූවන්ගේ කුසලතා සංවර්ධනය

සෞඛ්‍ය වෘත්තිකයන්ගේ හා එහි අනුශාංගික සේවාවල නිරතවූවන්ගේ කුසලතා සංවර්ධනය උදෙසා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නිපුනතා සංවර්ධන වැඩසටහන් පවත්වනු ලබයි. විශේෂයෙන් සෞඛ්‍ය සේවාවන්ට අදාලව ළමා හිතකාමී සෞඛ්‍ය සේවා පද්ධතියක් ගොඩනැගිම දරුවන්ට අදාල කරුනු පිළිබඳව සෞඛ්‍ය වෘත්තිකයන් සංවේදි කිරීම ළමා අරක්ෂාව සම්බන්ධ වඩාත් සාධනීය ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය දැනුම ලබා දිම මෙකි වැඩසටහන් මගින් අපේක්ෂිතය. එමෙන්ම සෞඛ්‍ය වෘත්තිකයන් හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අතර පවත්නා සබඳතාවය තවදුරටත් ශක්තිමත් කිරීම තුළින් ළමා ආරක්ෂාව සම්බන්ධ ඒකාබද්ධ ක්‍රියාමාර්ග සැකසීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මානය කිරීමද මෙමගින් අපේක්ෂිතය. ඒ අනුව පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ පශ්චාත්

උපාධිය හදාරන වෛද්‍යවරුන් හෙද හෙදියන් පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිණියන් මහජන සෞඛ්‍ය පරික්ෂක වරුන් ඇතුලු සෞඛ්‍ය වෘත්තිකයන් හා ආනුශාංගික සේවාවල නිරතවූවන් 509 දෙනෙකු උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.




## ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීම

ළමා ආරක්ෂාව පිළිබඳව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ ගුරු වෘත්තියට ප්‍රවේශවීමට අපේක්ෂාවෙන් සිටින ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයන්හි ඉගෙනුම ලබන ගුරු සිසුන් වෙත ළමා ආරක්ෂාව සම්බන්ධ දැනුම හා කුසලතා ලබාදීම තුළින් දරුවන් පිළිබඳ වඩාත් සංවේදී හා සවිඥානික ගුරු පරපුරක් බිහි කිරීමයි ඒ තුළින් දරුවන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් වළක්වා ගැනීමට මග පෙන්වීම මෙන්ම අවදානම් සහගත දරුවන් කල්තියා හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් අදාල අංශ දැනුවත් කිරීම තුළින් වඩාත් ඵලදායි ලෙස එම තත්වයන් කළමනාකරණය කරගැනීමට මගපෙන්වීමද අපේක්ෂිතය. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී පහත සඳහන් කරුණු පිළිබඳවද විශේෂ අවධානයක් යොමු කරන ලදි.

- ළමා අයිතිවාසිකම්, ළමා අපයෝජන සහ ඊට අදාළ නීතිමය පසුබිම හඳුනාගැනීම
- ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ගුරුවරයා සතුවගකීම් සහ කාර්යභාරය, අපයෝජන සිද්ධි සම්බන්ධයෙන් ගතයුතු පියවර හඳුනාගැනීම
- ළමා අපයෝජන වලක්වාගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග හඳුනාගැනීම
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ එහි කාර්යභාරය හඳුනාගැනීම
- ළමා මානසිකත්වය හඳුනාගැනීම සහ කායික දණ්ඩනයෙන් තොරව දරුවන් හික්මවීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හඳුනාගැනීම
- ළමා අපයෝජනයට ගොදුරුවූ සහ අපයෝජනයට ලක්වීමේ අවදානමක් සහිත ළමුන් හඳුනාගැනීම

**2013 වර්ෂයේදී විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 06 ක් පවත්වා ඇති අතර, එහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 912 ක් වේ.**





## ගැබිණි මව්වරුන් දැනුවත් කිරීම

මෙම වැඩසටහනේ මූලික අරමුණු වන්නේ පූර්ව ප්‍රසව අවධියේ සිටම ළමුන්ව ආරක්ෂා කරගැනීම හා පවුල තුළ ළමා හිතකාමී පරිසරයක් ගොඩනැගීමත් ළමයින් අපයෝජනයන්ගෙන් වළක්වා ගැනීමත්ය. ළමා සංවර්ධනය, සංගීත රසාස්වාදනය සහ ගැබිණි මව්වරුන්ගේ ආතති කළමණාකරනය සම්බන්ධයෙන්ද දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරයි. සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාල යටතේ ඇති ප්‍රාදේශිය සායනවල මව්වරුන් සහ අදාල පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ද ඇතුළත් වන පරිදි දීප ව්‍යාප්ත ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. ඒ අනුව 2013 වසරේ ගැබිණි මව්වරු දැනුවත් කිරීමේ වැඩසටහන් 128 ක් සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදුකර ඇත.

| දිස්ත්‍රික්කය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 5 |
| කළුතර | 5 |
| ගම්පහ | 5 |
| මහනුවර | 5 |
| මාතලේ | 6 |
| නුවරඑළිය | 6 |
| ගාල්ල | 5 |
| මාතර | 5 |
| හම්බන්තොට | 5 |
| යාපනය | 5 |
| මන්නාරම | 5 |
| වව්නියාව | 6 |
| කිලිනොච්චිය | 5 |

| | |
|---|---|
| මඩකලපුව | 5 |
| අම්පාර | 5 |
| ත්‍රිකුණාමලය | 5 |
| කුරුණෑගල | 5 |
| පුත්තලම | 6 |
| අනුරාධපුරය | 5 |
| බදුල්ල | 5 |
| මොණරාගල | 5 |
| රත්නපුරය | 4 |
| කෑගල්ල | 5 |
| පොළොන්නරුව | 5 |
| මුලතිව් | 5 |
| **මුළු එකතුව** | **128** |

## පාසල් සංවර්ධන සමිති ආශ්‍රිත දැනුවත් කිරීම

කායික මානසික ලිංගික හා නොසලකාහැරීම ආදි වශයෙන් සිදුවන සියලු ළමා අපයෝජනයන්ගෙන් තොර සුරක්ෂිත දරු පරපුරක් ගොඩනැගීම උදෙසා දෙමාපියන් සහ ගුරුවරුන් සතු වගකීම අවබෝධ කරදෙමින්, ඔවුන්ගේ දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් යුතුව ආරම්භ කරන ලද මෙම වැඩසටහන 2013 වසර තුළදී ද ක්‍රියාත්මක කරන ලදි. ඒ හරහා ළමා ආරක්ෂාව පිළිබඳව ගුරුවරුන්, දෙමාපියන් ඇතුලු භාරකරුවන් දැනුවත් කිරීම දීපව්‍යාප්තව සිදුකරන ලදි.

## දෙමාපියන් දැනුවත් කිරීම

ළමා අපයෝජන පිළිබඳ මෑත කාලීන අත්දැකීම් විශ්ලේෂණය කිරීමේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අවබෝධකරගත් සුවිශේෂි කරුණක් නම් දෙමාපියන්ගේ නොදැනුවත් භාවය සහ ඔවුන් විසින් ළමා මනස නිවැරදිව තේරුම් නොගැනීම, ළමා අපයෝජන සිදුවීම කෙරෙහි බලපාන ප්‍රධාන කරුණක් බවයි මෙම තත්ත්වය මත ළමා ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් දෙමාපියන් සතු කාර්යභාරය කුමක්ද යන්න හා එහිදි ඔවුන් සතුවිය යුතු කුසලතාවයන් කවරේද යන්න පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීමේ අරමුණින් දීප ව්‍යාප්ත වැඩසටහන් මාලාවක් දියත්කරන ලදි.

ළමයින්ගේ ආරක්ෂාව, සංවර්ධනය හා යහපැවැත්ම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී පවුල සතු කාර්යභාරය සුවිශේෂි වේ. එහිදී මව සහ පියාගේ කාර්යභාරය ඉතාමත්ම විශේෂ වේ. දෙමාපියන් තම දරුවන් වෙත අධ්‍යාපනය, ආහාර, ඇඳුම් වැනි මූලික අවශ්‍යතා ලබාදීම මෙන්ම ළමා අපයෝජනයන්ගෙන් ළමයින් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. ළමා අපයෝජන යනු කුමක්ද? ළමා අපයෝජන සිදු වු විට ක්‍රියාක්මක විය යුතු වන්නේ කෙසේද? ළමා අපයෝජනයක් දැනගත් අවස්ථාවකදී දැනුම්දිය යුත්තේ කුමන ස්ථානයකටද? යන කරුණු සම්බන්ධයෙන් සෑම දෙමාපියෙක් විසින්ම දැනුවත්වීම අනිවාර්යෙන්ම සිදුවිය යුතුමය.

දෙමාපියන් තම දරුවන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරීම තුළින් යහපත් පෞරුෂයෙන් පිරිපුන් ළමා පරපුරක් බිහි කිරීමට හැකියාව පවතියි. එම කරුණු සම්බන්ධයෙන් අවබෝධයක් ලබාදීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදුකරයි. 2013 වර්ෂයේදීද දිවයිනම ආවරණය වන පරිදි ළමා ආරක්ෂාව සම්බන්ධව  දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.




## ළමයින් දැනුවත් කිරීම

සියලු ආකාරයේ අපයෝජන වලින් ආරක්ෂා වීම පිළිබඳව ළමයින් දැනුවත් කළ යුතුමය. ඒ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය දීප ව්‍යාප්තව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදු කරයි. ළමයින්ගේ ආරක්ෂාව සලසාදීම වැඩිහිටියන්ගේ ප්‍රධාන වගකීමක් වන අතරම, ළමයින්ටත් තමා විසින්ම තම ආරක්ෂාව සලසා ගැනීම සඳහා කටයුතු කිරීමට වගකීමක් පවතියි. ළමයකු ඕනෑම ස්ථානයකදී කුමන හෝ වේලාවකදී අපයෝජනයට ලක්විය හැකිය. මෙම අපයෝජන තත්වයන්ගෙන් ආරක්ෂා වන්නේ කෙසේද තමන් හෝ තම මිතුරෙකු යම් අපයෝජන තත්ත්වයකට මුහුණදුන් අවස්ථාවකදී ඒ සඳහා ක්‍රියා කරන ආකාරය සම්බන්ධයෙන් සෑම ළමයෙකුම දැනුවත්විය යුතුය. 2013 වර්ෂයේදීද දිවයිනම ආවරණය වන පරිදි ළමා ආරක්ෂාව සම්බන්ධව පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.





## තරුණ කණ්ඩායම් දැනුවත් කිරීම

ගම තුළින්ම ළමා අපයෝජන අවම කිරීමට කටයුතු කිරීම සඳහා යෞවනයින් වෙත අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතා ලබාදීම මෙම වැඩසටහන තුළින් සිදුකරයි. ළමා අපයෝජන පිටු දැකීම සඳහා සමාජයේ විවිධ කණ්ඩායම් වල සහය ලබාගැනීම ඵලදායි වන බැවින්, ඒ සඳහා යෞවනයන් ඒකරාශිවී ක්‍රියාත්මක වන කුඩා කණ්ඩායම් අරමුණු කර ගනිමින් ළමා අපයෝජන සම්බන්ධයෙන් දැනුවත් කර, ඔවුන් විසින් ඉටුකළ යුතු සමාජ මෙහෙවරක් ලෙස සලකමින් ළමා අපයෝජන වැළැක්වීම සඳහා දායකත්වය ලබා ගැනීම මෙහිදී අපේක්ෂා කරයි. 2013 වර්ෂයේදීද දිවයිනම ආවරණය වන පරිදි ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් තරුණ කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

## ළමා නිවාස අධීක්ෂණ වැඩසටහන

ළමා රැකවරණය සපයන්නා වූ සියලු ආයතනයන් ප්‍රමිතිගත තත්වයන් යටතේ ළමා හිතකාමී අයුරින් පවත්වාගෙන යාම හා ඒ තුළ ළමයින්ගේ උපරිම යහපත තහවුරුවීම අත්‍යාවශ්‍ය කරුණකි. නමුත් ගෙවීගිය කාලපරිච්ඡේදය තුළ නිවාස ගත ළමයින්ට ආරක්ෂාව සැලසීම සම්බන්ධ බරපතල ගැටලුකාරී තත්වයක් පවතින බව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් හඳුනාගනු ලැබීය. විශේෂයෙන් ළමුන් ආයතනගත කිරීම, අවසන් විකල්පය වන අවස්ථා වලදී පමණක් කළයුතු දෙයක් වුවත් ලංකාවේ දෙමාපියන් දෙදෙනාම ජීවත් වන දරුවන් විශාල වශයෙන් ළමා නිවාස ගතකොට ඇත. මෙය ගැටලුකාරී තත්ත්වයකි. විශ්ව ළමා ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ දැක්වෙන අයුරින්ද ළමයකු ආයතනගත කිරීමෙන් පසු ළමයාගේ රැකවරණය, ආරක්ෂාව සහ අදාළ ස්ථානය පිළිබඳව හා ළමයා පිළිබඳව නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතුය. එමෙන්ම ආයතනගත දරුවන්ගේ උපරිම යහපත වෙනුවෙන් 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 14(ග) වගන්තිය ප්‍රකාරව, ආගමික හා පුන්‍යායතන මඟින් පවත්වාගෙන යනු ලබන ළමා රැකවරණ සේවා සපයන මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳ නියාමනය කිරීම සම්බන්ධ වැඩසටහන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ක්‍රියාත්මක කරයි. 2013 වර්ෂයේදී මෙම වැඩසටහන් සාර්ථකව පැවැත්වීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරියට හැකිවිය.

මෙම වැඩසටහන ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් නිළධාරීන්ගේ හා ප්‍රාදේශිය නිළධාරීන්ගේ සම්බන්ධීකරණය යටතේ ක්‍රියාත්මක විය. මෙහිදී දිවයින පුරා පිහිටි ආගමික සහ පුණ්‍යායතන මඟින් පාලනය වන සියලු ළමා නිවාස සම්බන්ධ තොරතුරු රැස් කරන ලද අතර, ළමා ආරක්ෂාවට සම්බන්ධ බහු ආංශික කමිටුවක් මඟින් ළමුන්ගේ කායික සහ මානසික සෞඛ්‍යය, සනීපාරක්ෂාව, අධ්‍යාපනය සහ රැකවරණය ආදී පුළුල් පරාසයක් තුළ විහිදුණු අධීක්ෂණයක් සිදු කරන ලදි. එසේම මෙම වැඩසටහන තුළදී ළමුන් උදෙසා මනෝසමාජීය ක්‍රියාකාරකම්ද භාවිතා කරන ලද අතර, දරුවන්ට සිය අදහස් ප්‍රකාශ කිරීමේ අවකාශයන්ද ලබාදෙන ලදි. පිළිගත් ප්‍රමිතීන්ට අනුව ආයතනගත රැකවරණය තුළ ළමුන්ගේ යහපැවැත්ම තහවුරු කිරීම උදෙසා මඟපෙන්වීම මෙහි අරමුණ විය. එමෙන්ම ළමා නිවාස ක්‍රමවත්ව පවත්වා ගැනීම පිළිබඳව විශේෂ සාකච්ඡාවක් 2013 ජනවාරි 4 වන දින පළාත් පරිවාස කොමසාරිස්වරුන්ගේද සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා පදනම්

ආයතනයේදී පවත්වන ලදි. එම සාකච්ඡාවේ පරමාර්තය වූයේ ආයතනගත දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳව ඒකාබද්ධ ප්‍රවේශයකින් ක්‍රියා කිරීමයි.

2013 වසරේදී පහත සඳහන් දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ළමා නිවාස 329 ක අධීක්ෂණ කටයුතු සිදු කර ඇත.

**2013 වසර තුළදී ළමා නිවාස අධීක්ෂණ වැඩසටහන් (දිස්ත්‍රික් අනුව)**

| දිස්ත්‍රික්කය | අධීක්ෂණය කරන ලද ළමා නිවාස ගණන |
|---|---|
| කොළඹ | 15 |
| කළුතර | 12 |
| ගම්පහ | 49 |
| මහනුවර | 21 |
| මාතලේ | 07 |
| නුවරඑළිය | 09 |
| ගාල්ල | 21 |
| මාතර | 15 |
| හම්බන්තොට | 04 |
| යාපනය | 23 |
| මන්නාරම | 05 |
| වව්නියාව | 12 |
| කිලිනොච්චිය | 07 |
| මඩකලපුව | 37 |
| අම්පාර | 13 |
| කුරුණෑගල | 20 |
| පුත්තලම | 11 |
| අනුරාධපුරය | 07 |
| බදුල්ල | 10 |
| මොණරාගල | 08 |
| රත්නපුරය | 08 |
| කෑගල්ල | 08 |
| පොළොන්නරුව | 03 |
| මුලතිව් | 04 |
| **මුළු එකතුව** | **329** |

## සුනාමි ව්‍යසනය හේතුකොට ගෙන වින්දිත වූ  දරුවන් සඳහා පුනරුත්ථාපන කටයුතු හා සුබසාධන කටයුතු සිදුකිරීම

2004 වර්ෂයේ දෙසැම්බර් 26 දින ඇතිවූ සුනාමි විපතෙහි ප්‍රතිඵලයක් වශයෙන් දෙමාපියන් අහිමි වූ වයස අවුරුදු 18ට අඩු සෑම ළමයෙකුටම හා අවුරුදු 21ට අඩු යෞවනයෙකුටත් දෙමාපිය දෙදෙනාගෙන් එක් අයෙකු අහිමිව හා ජීවත්ව සිටින මවට හෝ පියාට රැක ගැනීමට හා ආරක්ෂාව සැපයීමට හැකියාවක් නොමැති සෑම ළමයෙකුටම හා යෞවනයෙකුටම 2005 අංක 16 දරණ සුනාමි විශේෂ විධිවිධාන පනත මඟින් රැකවරණය සලසයි.

තවද අධිකරණයේ පරම භාරකාරත්වයට යටත්ව මාපියන් දෙදෙනාම අහිමි වූ සෑම ළමයෙකුගේමත් කැපකරු මාපිය රැකවරණ යටතේ තැබූ සෑම ළමයෙකුගේමත් භාරකාරත්වය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය දරයි. මේ අනුව සුනාමි ව්‍යසනය හේතු කොට ගෙන වින්දිත වූ දරුවන් උදෙසා සුභසාධනය  පසු විපරම් කටයුතු කැපකරු මාපිය රැකවරණ කටයුතු සිදු කරයි. එමෙන්ම මෙම ළමුන්ගේ සුභ සාධන ක්‍රමවේදයක් ලෙස මූල්‍ය ශිෂ්‍යාධාර ලබාදීමේ වැඩපිලිවෙලක් අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. 2013 වර්ෂයේදී සුනාමි ව්‍යසනය හේතුවෙන් වින්දිත වූ දරුවන් 227 දෙනෙකු වෙනුවෙන්  ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සුභසාධන කටයුතු සිදුකර ඇත. ඔවුන්ගෙන් මූල්‍යාධාර ලබාදුන් දරුවන් සංඛ්‍යාව 160කි. එමෙන්ම 2013.08.05 වන දින හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිටින, සුනාමි ව්‍යසනය හේතුවෙන් වින්දිත වූ දරුවන් 59 දෙනෙකු සඳහා විශේෂ සුභසාධන කඳවුරක්ද පවත්වන ලදී.




## සුරක්නා කැපකරු රැකවරණ ක්‍රමය

දශක 03 ක් පුරා පැවති බෙදුම්වාදී ගැටුම් හේතුවෙන් සිය ආදරණීය දෙමව්පියන් අහිමිව ළමා නිවාසගතවීමේ අවධානමේ පසුවූ ළමයින් එම තත්ත්වයෙන් මුදාගනිමින්, ඔවුන්ට පවුල් පරිසරයක් තුළ නිසි රැකවරණය සැලසිය හැකි කැපකරු රැකවරණ වැඩසටහනක් ලෙස සුරක්නා වැඩසටහන ක්‍රියාත්මක වේ. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ මූලධර්ම ගුරු කොටගනිමින් ළමයින් නිවාසගත නොකොට ඔවුන් ආසන්න ඥාතියෙකුගේ රැකවරණය මැද පවුල් පරිසරයක් තුළ ළමයාගේ උපරිම යහපත තහවුරු කිරීම මෙහි අරමුණයි. විවිධ දුෂ්කරතා හමුවේ ළමුන් වෙත රැකවරණ ලබාදෙන එම භාරකරුවන් වෙත අදාල දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා සපුරාලීමට

අතදීමක් වශයෙන් මාසිකව යම් මූල්‍ය ප්‍රතිපාදනයන් ජාතික ළමා ආරක්ෂක අරමුදල මඟින් ඔවුන් වෙත ලබාදීම සිදු කරයි. මෙම අරමුදලේ පරිත්‍යාග සඳහා දේශීය හා විදේශිය පරිත්‍යාගශිලීන් විසින් සිය දායකත්වය ලබාදෙයි.

2013 වර්ෂය වන විට "සුරක්නා" කැපකරු රැකවරණ වැඩසටහන යටතේ උතුරු පළාතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දරුවන් 53 දෙනෙක්ද, මුලතිව් දිස්ත්‍රික්කයේ දරුවන් 52 දෙනෙක්ද, මන්නාරම දිස්ත්‍රික්කයේ දරුවන් 84 දෙනෙක්ද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධීක්ෂණය යටතේ රැකවරණය ලැබීය.

## ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය සංවේදීකරණ වැඩමුළුව

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මඟින් දිනපතා පුවත්පත් සහ වෙබ් අඩවිවල පළවන ළමා අපයෝජන මෙන්ම ළමයින් සම්බන්ධ සියලුම ලිපි නියාමනය කිරීම සිදු කරයි. එහිදි ළමා අපයෝජන වාර්තා කිරීමේ මාධ්‍ය භාවිතය සමහර අවස්තාවලදී ඵලදායි නොවන බව අනාවරනය විය. එබැවින් ළමා අපයෝජන වාර්තා කිරීම පිළබඳව ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩමුළු 2 ක් මේ වසර තුළ පවත්වන ලද අතර ජනමාධ්‍යවේදීන් සඳහා වූ මාර්ගෝපදේශ අත්පොතක්ද මේ වසරේ නිකුත් කරන ලදි.



## ළමා හිංසනයට එරෙහි ජාතික දිනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර 1581/21 දරණ 2008 දෙසැම්බර් 26 නිකුත් කළ ගැසට් පත්‍රය මඟින් එවකට සිටි ළමා සංවර්ධන හා කාන්තා කටයුතු ආමාත්‍ය ගරු සුමේධා ජී ජයසේන මැතිණිය විසින් සෑම වසරකම ජනවාරි 04 දින ළමා හිංසනයට එරෙහි ජාතික දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලදි.

2013 වර්ෂයේ ළමා හිංසනයට එරෙහි ජාතික දිනය "දයාවෙන් සිනහවක්" යන තේමාව යටතේ ළමා සංවර්ධන හා කාන්තා කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තිස්ස කරල්ලියද්ද මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදි. මේ අවස්ථාවට පාසල් සිසුන් දෙමාපියන් ගුරුවරුන් රාජ්‍ය නිළධාරීන් ඇතුලු 1000 කට අධික පිරිසක් සහභාගි විය. එහිදී ළමා හිංසනය පිටු දැකීම සම්බන්ධයෙන් රැස්ව සිටි පිරිස දැනුවත් කිරීම සිදුකරන ලද අතර, පාසැල් දරුවන්ගේ සහභාගිත්වයෙන් සංස්කෘතික උළෙලක්ද පවත්වන ලදි.

## ළමා ශ්‍රමිකත්වයට එරෙහි ලෝක දිනය

ළමා ශ්‍රමිකත්වයට එරෙහි ලෝක දිනය ජූනි 12 වන දිනට යෙදී ඇත. මෙවරද මෙම දිනය "**ළමා ශ්‍රමයට නිමාවක්** "යන තේමාව යටතේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නුවරඑළිය නගරයේදි පවත්වන ලදි. ඊට පාසැල් 24 ක ළමුන් 1500 ක පමණ පිරිසක් සහභාගි විය. ළමා ශ්‍රමිකත්වය හා ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩමුලුවක්ද පාසල් දරුවන්ගේ හා ගුරුවරුන්ගේ සහභාගිත්වයෙන් සංස්කෘතික උළෙලක්ද පවත්වන ලදි. එහිදි සහභාගි වු සියලුම දරුවන්ට "1929" ළමා දුරකතන අංකය හා ළමා ශ්‍රමිකත්වය පිටුදැකීම පිළිබඳ පණිවිඩය මුද්‍රිත ටි ෂර්ට් සහ කැප් බෙදා දුන් අතර දැනුවත් කිරීමේ අත්පත්‍රිකාද බෙදා දෙන ලදි.





## තොරතුරු ලබා දීම

ළමා ආරක්ෂාව, ළමා අපයෝජනය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබාදීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරයි. එහිදී අවශ්‍යතාවය පරිදි පෝස්ටර්, අත් පත්‍රිකා, පොත්, ස්ටිකර්, මුද්‍රිත ප්‍රකාශන සහ රූපමය වාර්තා වැඩසටහන් ලබාදීම සිදු කරයි. 2013 වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා ආරක්ෂාව පිළිබඳ වූ ප්‍රකාශන 124957 ක් ජනතාව අතර බෙදා දී ඇත.



## ළමා ආරක්ෂාවට අදාල තොරතුරු ජනමාධ්‍ය හරහා ජනතාව අතරට රැගෙනයාම

රටතුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමට අදාල තොරතුරු ජනමාධ්‍ය ආයතන හා සම්බන්ධීකරණය වෙමින් මහජනතාව අතරට රැගෙනයාමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කටයුතු කරයි එහිදි විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍යන්ගේ සහයෝගයද ලබා ගැනේ. ළමා ආරක්ෂාවට අදාලව ප්‍රවෘත්ති නිවේදන ජනමාධ්‍ය වෙත නිකුත් කිරීම, විෂය කරුණු වලට අදාලව ප්‍රවෘත්ති සාකච්ඡා පැවැත්වීම, රූපවාහිනී හා ගුවන් විදුලි දැන්වීම් ප්‍රචාරය කිරීම සහ පුවත්පත් දැන්වීම් පලකිරීම ආදිය සිදු කරයි. 2013 වර්ෂයේදී රූපවාහිනී දැන්වීම් 2 ක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නිෂ්පාදනය කරණ ලදි. එමෙන්ම ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ලබාදීමද සිදු කරයි.



## ප්‍රදර්ශන හා ජංගම සේවා පැවැත්වීම

විවිධ ආයතන මඟින් අධ්‍යාපනික ප්‍රදර්ශන සංවිධානය කරනු ලබන අතර, ලැබෙන ඉල්ලීම් මත එම ප්‍රදර්ශන සඳහා ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීමේ අධ්‍යාපනික ප්‍රදර්ශන කුටි එකතු කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කටයුතු කරයි. එමෙන්ම ප්‍රාදේශිය මට්ටමින් පවත්වන ජංගම සේවා සඳහා ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සිය දායකත්වය ලබා දීම සිදු කරයි. 2013 වර්ෂයේදී අම්පාර ප්‍රදේශයේ පවත්වන ලද දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය ඇතුලු අධ්‍යාපනික ප්‍රදර්ශන රැසකට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සිය දායකත්වය සපයමින්, ළමා ආරක්ෂාව පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සඳහා කටයුතු කර ඇත.



## ළබැඳි පුවත් හසුන


ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
ළබැඳි
1929
ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය

පුවත් හසුනකට වඩා වැඩි යමක් යන තේමාව යටතේ සැකසුනු ළබැඳි නමින් වූ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල පුවත් හසුන ත්‍රෛමාසිකව ප්‍රකාශයට පත් කිරීම අධිකාරිය විසින් සිදු කරනු ලබයි මෙය සාම්ප්‍රධායික පුවත් හසුනකට වඩා වෙනස් වූ අයුරකින් ප්‍රකාශයට පත් වන්නකි. මෙහි මූලික අරමුණ වන්නේ ළමා ආරක්ෂාව පිළිබඳව ගුරුවරුන් දෙමාපියන් දරුවන් ඇතුලු සියලු ප්‍රජාව දැනුවත් කිරීමයි කාලීන වශයෙන් වූ තේමාවක් තොරාගනිමින් ළබැඳි පුවත් හසුන නිර්මාණය කෙරේ 2013 වර්ෂයේදී 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය, ළමා ශ්‍රමිකත්වය පිටු දකිමු සහ ළමුන් ආරක්ෂා කිරීම සඳහා දෙමාපියන්ගේ කාර්යභාරය වැනි මාතෘකා ඔස්සේ ළබැඳි පුවත් හසුන ප්‍රකාශයට පත් කරන ලදි.

## සමස්ත ලංකා ළමා චිත්‍ර තරගය 2013

ළමා ආරක්ෂාව පිළිබඳ මතය ළමයින් තුළ ප්‍රචලිත කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමස්ත ලංකා මට්ටමින් ළමා චිත්‍ර තරගයක් පවත්වන ලදි. වයස් කාණ්ඩ 4 ක් යටතේ තේමාවන් 4 ක් ඔස්සේ මෙම සමස්ත ලංකා චිත්‍ර තරගය පැවැත්වූ අතර, ඊට දිවයින පුරා විසිරී සිටින දරු දැරියන් විශාල සංඛ්‍යාවක් සිය සහභාගීත්වය දක්වන ලදි ජයග්‍රාහකයන් සඳහා සමස්ත ලංකා හා දිස්ත්‍රික් මට්ටමින් පදක්කම් ත්‍යාග හා සහතිකපත් පිරිනමන ලදි.




## මනෝසමාජීය වැඩසටහන්

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ ක්‍රියාත්මක වන මනෝසමාජීය අංශය මගින් 2013 වර්ෂය තුළදී දැයේ දරුවන්ගේ උපරිම යහපත වෙනුවෙන් විවිධ වැඩසටහන්, පුහුණු සැසි, වැඩමුලු, සාකච්ඡා, රැස්වීම් හා ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. 2013 වර්ෂයේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් මනෝසමාජ සේවා 2836ක් ලබා දී ඇති අතර මානසිකත්ව තක්සේරු කිරීම්, මනෝ උපදේශනය හා මනෝ චිකිත්සක සේවා 567ක් ලබා දී ඇත. එමෙන්ම වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා පැමිණෙන වින්දිත ළමුන් එම පටිගත කිරීමේ කාර්යය සඳහා මානසිකව සූදානම් කිරීමද අධිකාරියේ මනෝසමාජීය ඒකකය විසින් සිදුකරයි. 2013 වර්ෂය තුළදී එවැනි මානසික සූදානම් කිරීම් 152ක් සිදුකර ඇත. විශේෂයෙන් සෘජුව හා 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව හරහා වාර්තාවූ ළමා අපයෝජන පැමිණිලි සම්බන්ධව දිස්ත්‍රික් මනෝසමාජීය නිළධාරී, දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිළධාරීන් හා ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිළධාරීන් හරහා මනෝසමාජීය සහන ලබාදීම සහ එම පැමිණිලි වලට අදාළ උචිත ක්‍රියාමාර්ග ගැනීමද මනෝසමාජීය ඒකකය මගින් සිදුකරනු ලබයි.



## ප්‍රාදේශීය ළමා ආරක්ෂක හා මනෝසමාජීය නිලධාරින් බඳවා ගැනීම

ශ්‍රී ලාංකේය ළමා ආරක්ෂක ඉතිහාසයේ නව සංධිස්ථානයක් සනිටුහන් කරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ප්‍රාදේශීය ළමා ආරක්ෂක හා මනෝසමාජීය නිළධාරින් 360 ක් බඳවා ගැනිමේ මුලික අදියර ක්‍රියාත්මක කරමින් 2013 වසරේ අධිකාරියට ප්‍රාදේශීය ළමා ආරක්ෂක හා මනෝසමාජීය නිළධාරින් බඳවා ගැනීම ආරම්බ කළ අතර, එලෙස බඳවාගත් නවක නිළධාරීන් යොදවාගනිමින් වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දීමට කටයුතු කරන ලදි.





## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මඟින් ළමා ආරක්ෂාවට අදාලව විවිධ මාතෘකා ඔස්සේ අධ්‍යයන පැවැත්වීම

2013 වර්ෂය තුළදී ළමා අරක්ෂාවට සම්බන්ධ පහත මාතෘකා 3 ට අදාලව අධ්‍යයනයන් ආරම්භ කර ඇත.

- ළමා ජාවාරම්කරණයට එරෙහි නීති අකාර්යක්ෂම ලෙස ක්‍රියාත්මවීමට හේතු තහවුරු කරගැනීම සඳහා අධ්‍යයනය.
- පාසල්වල සපයන උපදේශන සේවාවල ගුණාත්මක තත්වය.
- දරුවන්ගේ ආරක්ෂිත අධ්‍යාපනය පිළිබඳව දැනට පවතින තත්වය නිර්ණය කිරීම පිළිබද අධ්‍යයනය.

මේවායේ මූලික අරමුණු ලෙස ළමා ජාවාරම් වැලැක්වීම **Child Trafiking** පිළිබඳ නීති වඩාත් ඵලදායි අන්දමට ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කිරීම, සුරක්ෂිත අධ්‍යාපනය පිළිබඳව කුසලතාවයන් පාසල් ළමුන්ගේ, ගුරුවරුන්ගේ හා දෙමාපියන්ගේ දැනුම, ආකල්ප සහ වර්ධනයට ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම, පාසල්වල සපයන උපදේශන සේවාවල ගුණාත්මක භාවය පිළිබඳ හඳුනාගැනීම සහ එම සේවාවන් වර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම යනාදිය පෙන්වා දිය හැකිය.

## දිරිදරු සුරැකුම් පියස සම්පත් මධ්‍යස්ථාන

දිරිදරු සුරැකුම් පියස සම්පත් මධ්‍යස්ථාන හරහා දැයේ දරුවන්ට විශාල මෙහෙවරක් සිදුවේ. විශේෂයෙන් දෙමව්පියන් විදේශ ගතවීම මෙන්ම මව් පිය දෙදෙනාම රැකියාවට යාම වැනි කරුණු මත අනාරක්ෂිත වන දරුවන්ගේ රැකවරණය සැලසීම ප්‍රධාන අරමුණු කොට ගනිමින් මෙම මධ්‍යස්ථාන පිහිටුවා ඇත. එමෙන්ම මෙකී මධ්‍යස්ථාන මගින් ළමා අපයෝජන පිටු දැකීම සහ ළමුන්ගේ ආරක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්, මනෝසමාජීය ක්‍රියාකාරකම්, පෞරුෂ සංවර්ධන වැඩසටහන්, සෞන්දර්යය සහ රසාස්වාදනය ඉහළ නැංවීමේ ක්‍රියාකාරකම්, විභාග ක්‍රියාකාරකම් පදනම් කරගත් වැඩසටහන් යනාදි ක්‍රියාකාරකම් කෙරේ.




මෙම මධ්‍යස්ථාන පිහිටුවා ඇති ප්‍රදේශ,

- කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කිඹුල්වානාඔය ජනපදය තුළ විදේශගත මව්පියන්ගේ දරුවන් වෙනුවෙන් ස්ථාපිත කර ඇත.
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ විජයපුර ජනපදය තුළ ස්ථාපිත කර ඇත.
- පුත්තලම දිස්ත්‍රික්කයේ තබ්බෝව බුද්ධි දියවර ගම්මානය තුළ ස්ථාපිත කර ඇත.
- අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුනේ ඉස්ලාමාබාද් සුනාමි නිවාස සංකීර්ණය තුළද ස්ථාපිත කර ඇත.

## ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන

ළමා ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියා කරනු ලබන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කිරීම සහ ළමා උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන තුළින් සිදුවේ. අධිකාරිය විසින් 2009 වසරේදී ප්‍රථම ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථානය වව්නියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේදී පිහිටුවමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයන්හි ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩපිළිවලක් ආරම්භ කරන ලදි.

2013 වසරේදී මුලතිවු දිස්ත්‍රික්කයේ ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් පිහිටුවූ අතර, මේවන විට වව්නියාව, කිලිනොච්චිය, හම්බන්තොට හා මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන පිහිටුවා ඇත.

## සුරැකි පියස ළමා සුරැකුම් මධ්‍යස්ථානය

වින්දිත ළමයින්ගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත යටතේ 14 (ඉ) සහ (ඒ) වගන්ති ප්‍රකාරව කටයුතු කරමින් ඔවුන්ගේ රැකවරණය වෙනුවෙන් වෙනම ස්ථානයක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබයි. මෙහිදී වින්දිත දරුවන් සුරක්ෂිතව තබා ගනිමින්, ඔවුන්ගේ අයිතීන් උපරිමයෙන් ආරක්ෂා කර දෙමින්, ඔවුන්ට අවශ්‍ය මනෝසමාජීය සහය ලබාදෙමින්, ඔවුන්ගේ මානසික මට්ටම යහපත් කර මනා පෞරුෂයකින් හෙබි දරුවන් සමාජගත කිරීමට අවශ්‍ය පදනම සකස් කරනු ලබයි. මෙම සුරැකි පියස යටතේ 2013 වර්ෂයේදී ළමුන් 95 දෙනෙකු සඳහා රැකවරන සපයාදී ඇත. විශේෂයෙන් සුරැකි පියස ළමා සුරැකුම් මධ්‍යස්ථානය තුළ සිටින ළමයින්ගේ අධ්‍යාපන අවශ්‍යතා පිළිබඳ සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදුකරන ලදි.



## ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තියේ කෙටුම්පත එළිදැක්වීම

ළමයාගේ වටිනාකම හඳුනාගනිමින් ඔවුන්ට අභිමානවත් ළමාවියක් උරුම කර දීමේ අරමුණ පෙරදැරිව ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තියේ කෙටුම් පත 2013 වසරේ දී එළි දැක්වීම සිදුකරන ලදි. ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ කාර්යයේ නියැලී සිටින සියලු පාර්ශවයන්ට අදාල විධිමත් මඟපෙන්වීම් සහිත ප්‍රතිපත්තියක් පැවතීමේ අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් අනතුරුව ඊට පිළියම් ලෙස ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් මෙම ප්‍රතිපත්තිය කෙටුම්පත් කරන ලදී. ළමා

අපයෝජනයන් වලක්වා ගැනීම අපයෝජනයකදී ඊට සාධනීය ප්‍රතිචාර දැක්වීම යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය තුළ ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම වින්දිත රැකවරණය තහවුරු කිරීම සහ ඔවුන් නැවත සමාජ ගතකිරීම ළමා ආරක්ෂාවට අදාල කරුණු සම්බන්ධ නව ප්‍රමිතීන්ද මෙම ප්‍රතිපත්තිය තුළට අන්තර්ගත කොට ඇත.

## ළමා රැකවරණ මධ්‍යස්ථාන සඳහා වූ මඟපෙන්වීම් හා ප්‍රමිතීන් ඇතුළත් කෙටුම්පත එළිදැක්වීම

දේශයේ සෑම දරුවකුගේම රැකවරණය එකසේ තහවුරු කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන ළමා හිතකාමී පරිසරයක් තුළ ආයතනගත ළමුන්ගේ උපරිම යහපත තහවුරු කිරීම උදෙසා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මාර්ගෝපදේශකත්වයෙන් සහ විද්වත් කමිටුවක් දායකත්වයෙන් කෙටුම්පත් කරන ලද ළමා රැකවරණ මධ්‍යස්ථාන සඳහා වූ මගපෙන්වීම සහ ප්‍රමිතීන් ඇතුළත් කෙටුම්පත එළි දැක්වීම 2013 වර්ෂයේදි සිදුකරන ලදි.





## 1939 අංක 048 දරණ ළමා හා යෞවන ආඥා පණත සංශෝධනය පිළිබඳ ඉදිරි පියවර ගැනීම

අධිකරණය ඉදිරියට එන ළමුන් වෙනුවෙන් සැලසෙන නෛතික රැකවරණය සහ සුරක්ෂිතභාවය තහවුරු කිරීමට අවශ්‍ය වන නීතිමය ප්‍රතිපාදන ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙන් අපේක්ෂිත මට්ටමට ළඟා කරලීම සඳහා මීට පෙර සකස් කොට තිබූ සංශෝධන ආශ්‍රිත වූ නව කෙටුම්පත ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් වර්තමානයට අදාල ලෙස සංශෝධනය කරමින් රජය වෙත ඉදිරිපත් කිරීම 2013 වර්ෂයේදී සිදුකරන ලදි.

## විශේෂ පොලිස් විමර්ශන

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ව්‍යවස්ථාදායකය මඟින් පාර්ලිමේන්තුවේ සර්වජන ඡන්දයෙන් සම්මත කර ගනු ලැබූ 1998 අංක 50 දරණ පනතින් පවරා ඇති බලතල අනුව ළමා අපයෝජන පිළිබඳ විශේෂ විමර්ශන පැවැත්වීම සඳහා 2001 වසරේ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ ශ්‍රේණියේ නිළධාරියෙකු සහ තවත් එක් නිළධාරියෙකු පොලිස්පතිවරයා විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ඉල්ලීම මත අනුයුක්ත කරන ලදි. ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ

විශේෂ විමර්ශන පැවැත්වීමේ බලතල අනුව විමර්ශන කටයුතු පැවැත්වීම සාර්ථක වූ අතර, දේශිය මෙන්ම විදේශීය ළමා අපයෝජකයන් කොටු කර ගැනීම සාර්ථක වූවාක් මෙන්ම දිවයිනේ මෙන්ම විදේශයන්හි පවා අපයෝජකයන්ට එරෙහිව නඩු පවරා නීතිය ක්‍රියාත්මක කරන ලදි.

එම විමර්ශන පුළුල් කිරීම වස් 2002 වර්ෂයේ ඔක්තෝම්බර් පළමු වැනිදා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යටතේ විශේෂ පොලිස් විමර්ශන ඒකකයක් නිළධාරීන් 15 දෙනෙකුගෙන් යුක්තව පිහිටුවන ලදි. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය ඔස්සේ හා වෙනත් ක්‍රම වලින් මහජනතාවගෙන් ලැබෙන ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි කඩිනමින් විමර්ශනය කිරීමත්, එම විමර්ශන ස්වාධීනව සිදුකර නීතිය ක්‍රියාත්මක කිරීමත් මෙම ඒකකය මඟින් සිදුකරයි.

1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවයට ලැබෙන පැමිණිලි කඩිනමින් අදාල පොලිස් ස්ථානවලට බැහැරකර කඩිනමින් ඒ පිළිබඳ ක්‍රියාත්මක වීමට මේ වන විට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකකය විසින් සිදුකරමින් පවතින සුවිශේෂී කාර්යභාරයකි. ඒ සඳහා 24 පැය පුරාවටම ක්‍රියාත්මක වන නිළධාරින් කණ්ඩායමක්ද මෙම ඒකකයේ යොදවා ඇත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරන, අපයෝජනයට පත් දරුවන්ගේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ කර්තව්‍යය සඳහා ද විශේෂ පොලිස් විමර්ශන ඒකකයේ නිළධාරින්ගේ සහයෝගය හිමිවේ. 2013 වර්ෂය තුළ විශේෂ පොලිස් විමර්ශන ඒකකයට පමණක්, පැමණිලි හා තොරතුරු 198 ක් වාර්තා වී ඇත. 2013 වර්ෂයේ දෙසැම්බර් මස වන විට නිළධාරීන් 33 දෙනෙකු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකයට අනුයුක්තව සේවය කළ අතර, ඔවුන් දිවයිනම ආවරණය වන පරිදි විමර්ශන රාජකාරිවල නිරතවිය.

## ළමා අපයෝජන වින්දිතයන්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතයන් බවට පත්වන ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ විශේෂ ඒකකයක් ක්‍රියාත්මක වේ 1999 අංක 32 දරණ සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව, අපයෝජනයට ගොදුරුවී ඇති ළමයෙකුගේ සාක්ෂිය වීඩියෝ පටිගත කර එය අධිකරණය වෙත ඉදිරිපත් කිරීමත් මෙමඟින් බලය ලබා දී ඇත. 2013 වසර තුළ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 159 ක් සිදු කර ඇත.

## ළමා අපයෝජන නඩු කටයුතු සඳහා ජාන පරික්ෂාව

මෙය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මඟින් සිදුකරන සුවිශේෂී කටයුත්තකි. දිවයිනේ පොලිස් ස්ථානයන්ගෙන් අධිකාරිය වෙත ලැබෙන ඉල්ලීම් හා අධිකරණ නියෝග මත ළමා අපයෝජන නඩු කටයුතු වල සැකකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ජාන පරික්ෂණ සිදු කිරීමට අවශ්‍ය මූල්‍ය කටයුතු ලබාදීම සිදුකරයි.

## නීතිමය කර්තව්‍යන්

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත ප්‍රකාරව අපයෝජනයට ගොදුරු වූ දරුවන් ආරක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ අයිතීන් තහවුරු කිරීමට ක්‍රියාමාර්ග ගැනීම, අපයෝජනය වැළැක්වීම සඳහා වූ නීතිමය පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම, ළමා අපයෝජන වලට අදාල නීති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම, නීති උපදෙස් ලබා දීම සහ ළමා අපයෝජන සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතු වල ප්‍රගතිය නියාමනය කිරීම හා ඊට අදාලව අධිකරණයන්හි පෙනී සිටීම යනාදි කාර්යයන් නීති අංශය මඟින් ඉටු කරනු ලැබේ. අධිකාරි පනතට අමතරව පනත් කිහිපයක් මගින් අධිකාරිය වෙත බලය ලැබී ඇත.

- 2006 අංක 16 දරණ සුනාමි විශේෂ විධිවිධාන පනත.
- 2005 අංක 34 දරණ ගෘහස්ත ප්‍රචන්ඩ ක්‍රියා වැලැක්වීමේ පනත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ ක්‍රියාත්මක නීති අංශය මඟින් නීති උපදෙස් ලබාදීම් 2856 ක් සිදු කර ඇත. එමෙන්ම 2013 වසරේ අධිකරණයේ පෙනී සිටීම් 248 ක් සඳහා මෙම ඒකකයේ නිලධාරීන් සහභාගී වී ඇත. අධිකාරියෙන් පිටත පවත්වන ලද රැස්වීම් 36 කට සහභාගී වී ඇති අතර දේශන 41 ක් පැවැත්වීමටද, මෙම ඒකකයේ නිලධාරීන් දායක වී ඇත.

**2013 වසර තුළදී නීති අංශය දායකවූ නඩු සංඛ්‍යාව (2005 අංක 16 දරණ සුනාමි විශේෂ විධිවිධාන පනත අනුව)**

| අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|
| බත්තරමුල්ල ළමා අධිකරණය | 23 |
| ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 34 |
| කල්මුනේ මහේස්ත්‍රාත් අධිකරණය | 59 |
| බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණය | 13 |
| මාතර මහේස්ත්‍රාත් අධිකරණය | 25 |
| හම්බන්තොට මහේස්ත්‍රාත් අධිකරණය | 72 |
| කලුතර මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| **මුළු සංඛ්‍යාව** | **227** |


**2013 වසර තුළ නීති අංශය දායකවූ නඩු සංඛ්‍යාව (ළමා අපයෝජන සිද්ධි සඳහා)**

| අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 05 |
| කොළඹ මහාධිකරණය | 01 |
| ගාල්ල මහාධිකරණය | 01 |
| කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය | 02 |
| ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණය | 06 |
| කැස්බෑව මහේස්ත්‍රාත් අධිකරණය | 02 |
| මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| **මුළු සංඛ්‍යාව** | **21** |

## ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි

ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබෙන ආකාර කිහපයකි "1929" ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය හරහා පැමිණිලි විශාල ප්‍රමාණයක් ලැබෙන අතර, අධිකාරියට පැමිණ වාචිකව පැමිණිලි ඉදිරිපත් කිරීම මගින්ද, ලිපි මගින්ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි සිදුකරනු ලබයි. මෙම ලැබෙන පැමිණිලි සියල්ල කඩිනමින් විභාගයට ගැනෙන අතර, පැමිණිල්ලේ ස්වභාවයට අනුව වර්ග කිරීමකට ද ලක්වේ. 2013 වර්ෂය තුළදී ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි 10273 වාර්තා වී ඇති අතර, වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ළමා හිංසනය සම්බන්ධයෙනි එම සංඛ්‍යාව 2030 කි. අනිවාර්ය අධ්‍යාපනය ලබා නොදීම පිළිබඳ පැමිණිලි 1263 ක් වාර්තා වී ඇති අතර, ළමා හා යෞවන ආඥා පනතට අදාලව නොසලකා හැරීම් පිළිබඳ පැමිණිලි 1101 ක් වාර්තා වී ඇත. ස්ත්‍රී දූෂණයට අදාල පැමිණිලි 691 ක් ද බරපතල ලිංගික අපයෝජනයට අදාල පැමිණිලි 681 ක් ද ලිංගික හිරිහැර කිරීම් වලට අදාල පැමිණිලි 400 ක් ද 2013 වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තා වී ඇත. ලැබී ඇති ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි 10273 න් 9427 ක්ම 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය ඔස්සේ ලැබී තිබීම විශේෂත්වයකි. වෙනත් මාධ්‍යය ඔස්සේ ලද පැමිණිලි සංඛයාව 846කි.

**2013 වසර තුළදී අධිකාරියට වාර්තා වූ ළමයින් සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව (දිස්ත්‍රික්කය අනුව)**



## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

(රුපියල් වලින්)

| විස්තරය | 2013 | 2012 |
|---|---|---|
| ***ආදායම*** | | |
| පුනරාවර්තන ප්‍රධාන - මහාභාණ්ඩාගාරය | 89,651,116.00 | 49,362,000.00 |
| - අනෙකුත් ආයතන | 20,132,398.18 | 12,953,345.55 |
| අනෙකුත් ආදායම් | 6,968,432.76 | 1,264,617.87 |
| ජාතික ක්‍රියාකාරීත්ව සැලැස්ම සඳහා භාණ්ඩාගාර ප්‍රධාන | 23,400,000.00 | 7,190,000.00 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල සඳහා ප්‍රධාන | 4,170,642.69 | 1,681,263.14 |
| ***මුළු ආදායම*** | **144,322,589.63** | **72,451,226.56** |
| ***වියදම්*** | | |
| සේවක වැටුප් හා වේතන | 69,882,714.01 | 39,941,739.65 |
| ගමන් වියදම් | 1,782,381.54 | 997,104.98 |
| සැපයුම් හා පාරිභෝගික සේවා | 3,818,999.76 | 2,630,004.07 |
| නඩත්තු වියදම් | 3,654,490.46 | 2,376,196.00 |
| ගිවිසුම්ගත සේවා | 9,095,417.70 | 6,710,020.02 |
| ක්ෂය වීම් | 7,386,630.87 | 6,896,720.34 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 4,461,531.45 | 316,472.07 |
| ජාතික ක්‍රියාකාරීත්ව සැලැස්ම වියදම් | 18,192,725.29 | 6,436,898.56 |
| ව්‍යාපෘති වියදම් | 23,769,207.01 | 15,343,497.00 |
| සුනාමි ආධාර ව්‍යාපෘති වියදම් | 158,076.00 | 158,076.00 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල - වියදම් | 3,568,542.48 | 2,066,360.00 |
| මූල්‍ය වියදම් | 12,805.07 | 6,740.00 |
| ***මුළු වියදම්*** | **145,783,521.64** | **83,879,828.69** |
| **ශුද්ධ අතිරික්තය / ඌනතාවය** | **(1,460,932.01)** | **(11,428,602.13)** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

2012.12.31 දිනට මූල්‍ය ප්‍රකාශය

(රුපියල් වලින්)

| විස්තරය | 2013 | 2012 |
|---|---|---|
| **වත්කම්** | | |
| ***ජංගම වත්කම්*** | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 854,581.58 | 6,190,049.88 |
| ලැබිය යුතු ගිණුම් | 22,936,740.80 | 14,598,419.30 |
| භාණ්ඩ තොගය - ලිපි ද්‍රව්‍ය | 184,990.37 | 91,104.06 |
| කලින් ගෙවීම් | 627,708.05 | 550,960.72 |
| ආපදා ණය ආපසු ගෙවීම් | 470,734.14 | 340,010.57 |
| | **25,074,754.94** | **21,770,544.53** |
| ***ජංගම නොවන වත්කම්*** | | |
| ලැබිය යුතු ආපදා ණය | 239,789.88 | 370,513.45 |
| ආයෝජන /ඉතිරිකිරීම් | 24,233,527.05 | 22,367,914.84 |
| දේපළ පිරියත හා උපකරණ | 92,320,831.86 | 94,996,317.63 |
| | **116,794,148.79** | **117,734,745.92** |
| **මුළු වත්කම්** | **141,868,903.73** | **139,505,290.45** |
| **වගකීම්** | | |
| ***ජංගම වගකීම්*** | | |
| ගෙවිය යුතු ගිණුම් | 11,501,776.82 | 5,406,372.93 |
| කෙටිකාලීන ප්‍රතිපාදන | 962,327.14 | 815,608.57 |
| | **12,464,103.96** | **6,221,981.50** |
| ***ජංගම නොවන වගකීම්*** | | |
| දිගුකාලීන ප්‍රතිපාදන | 2,619,501.87 | 2,031,945.00 |
| සීමාසහිත අරමුදල් | 528,404.00 | 1,762,904.00 |
| ව්‍යාපාති අතිරික්තය හෝ ඌනතාවය | 11,638,386.35 | 16,270,219.24 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල | 144,157.69 | 940,829.48 |
| | **14,930,449.91** | **21,005,897.72** |
| ***මුළු වගකීම්*** | **27,394,553.87** | **27,227,879.22** |
| | | |
| ***ශුද්ධ වත්කම්*** | **114,474,349.86** | **112,277,411.23** |
| **මූල්‍යනය වන්නේ** | | |
| ඉ.රැ.ආ. අතිරික්තය / ඌනතා | (32,832,134.31) | (24,336,856.49) |
| පසුගිය වසරේ ගැලපීම් | (3,834,913.98) | |
| අතිරික්තය / ඌනතා - 2013 | 1,731,852.61 | (8,495,277.82) |
| ඉ.රැ.ආ. අතිරික්තය / ඌනතා | (34,935,195.68) | |
| ප්‍රග්ධන ප්‍රධානයන් | 134,256,426.54 | 129,956,426.54 |
| ප්‍රග්ධන සංචිත | 2,153,119.00 | 2,153,119.00 |
| ප්‍රත්‍යාගණන සංචිත | 13,000,000.00 | 13,000,000.00 |
| | **114,474,349.86** | **112,277,411.23** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(රුපියල් වලින්)

| විස්තරය | 2013 | 2012 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වු මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වු අතිරික්තය (ඌනතාවය) | (1,460,932.01) | (11,428,602.13) |
| **මුදල් නොවන සංචලනයන්** | | |
| ක්ෂයවීම් | 7,714,034.67 | 7,668,381.89 |
| ගෙවිය යුතු ගිණුම් වල වැඩිවීම් | 6,095,403.89 | 4,095,174.72 |
| කෙටිකාලීන වෙන්කිරීම් වැඩිවීම් | 146,718.57 | 571,305.98 |
| තොග වැඩිවීම | (93,886.31) | 57,346.01 |
| ලැබිය යුතු ගිණුම් වල වැඩිවීම් | (8,338,321.50) | (8,832,333.51) |
| කලින් ගෙවුම් වැඩිවීම් | (76,747.33) | (259,528.99) |
| ආපදා ණය වල වැඩිවීම් | (130,723.57) | (125,355.98) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වු ශුද්ධ මුදල් ප්‍රමාණයන්** | **3,855,546.41** | **(8,253,612.01)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වු ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | (5,038,548.90) | (30,388,474.00) |
| දිගුකාලීන ලැබිය යුතු ගිණුම් වල අඩුවීම් | 130,723.57 | 125,355.98 |
| ප්‍රත්‍යාගණන ශේෂය වැඩිවීම් | - | 13,000,000.00 |
| ආයෝජන ක්‍රියාදාමයන් | (1,865,612.21) | (1,066,672.05) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වු ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(6,773,437.54)** | **(18,329,790.07)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වු මුදල් ප්‍රවාහයන්** | | |
| පාරිතෝෂික වෙන් කිරීම් වල වැඩිවීම් | 587,556.87 | 449,205.00 |
| සීමාසහිත අරමුදල් වල වැඩිවීම්/අඩුවීම් | (1,234,500.00) | (250,000.00) |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රියාදාමයන් | 4,300,000.00 | 21,360,000.00 |
| රදවාගත් ඉපැයීම් වල වැඩිවීම් | (6,070,634.04) | 3,470,829.81 |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වු ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(2,417,577.17)** | **25,030,034.81** |
| | | |
| මුදල් සහ මුදල්වලට සාමානදෑ වල ශුද්ධ වැඩිවීම /අඩුවීම් | (5,335,468.30) | (1,553,367.27) |
| වර්ෂය මුල මුදල් සහ මුදල්වලට සාමාන දෑ | 6,190,049.88 | 7,743,417.15 |
| **වර්ෂය අග මුදල් සහ මුදල්වලට සාමාන දෑ** | **854,581.58** | **6,190,049.88** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } වයිඑස්/ඊ/එන්සිපීඒ/2013/1/05

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 අගෝස්තු 25 දින

සභාපතිනි,

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 22(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධානු ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිනිය වෙත 2014 නොවැම්බර් 12 දින නිකුත් කරන ලදී.

## 1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 <u>විගණකගේ වගකීම</u>

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.4 **මතය ව්‍යාවනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **මතය ව්‍යාවනය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01**

(i) මූල්‍ය ප්‍රකාශන සමඟ ශුද්ධ වත්කම්/හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) අධිකාරියේ ළමා ආරක්ෂක අරමුදල් හා ව්‍යාපෘතිවල ඉකුත් වර්ෂයේ සිදුවූ ගිණුම්කරණ දෝෂ වන පිළිවෙළින් රු.4,908,996 ක් රු.1,398,772 ක් හා රු.714,024 ක් අදාළ කාල පරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කර ඉදිරිපත් කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ඉදිරියට ගෙන එන ලද ආදායමට ශුද්ධ ප්‍රතිඵලය ගලපා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07**

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.25,893,649 ක් වූ වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද එහි සාධාරණ අගය ගිණුම්වල පෙන්නුම් කිරීම සඳහා වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

2

### 2.2.2 <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

අධිකාරිය රජයේ ප්‍රදාන මත ස්ථාවර වත්කම් මිලදී ගැනීම සිදුකරනු ලබන අතර සමාලෝචිත වර්ෂයේ අවසානයේ රු.මිලියන134 ක රජයේ ප්‍රදාන හා රු.මිලියන 92 ක ස්ථාවර වත්කම් පවතින නමුත් වත්කම් මත ක්‍රමක්ෂය කිරීම සඳහා ගිණුම් ප්‍රතිපත්තියක් අධිකාරිය විසින් හඳුන්වා දී නොතිබුණි.

### 2.2.3 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අධිකාරිය විසින් ක්‍රමවත් ගිණුම්කරණ පද්ධතියක් පවත්වා තිබිය යුතු නමුත් ජ'නල් සටහන් මගින් ලෙජරයට සිදුකර ඇති ගැලපීම සම්බන්ධයෙන් පහත දූර්වලතා නිරීක්ෂණය වූ බැවින් ලෙජර ගිණුම්වල නිරවද්‍යතාව සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

i වැරදි නිවැරදි කිරීම සඳහා ගිණුම් 12 කට අදාළව ජංගම වත්කම් ගිණුම් රු. 593,522 කින්ද වියදම් ගිණුම් රු. 223,892 කින්ද අනුමැතියකින් තොරව මකා වෙනස්කර තිබිණි.

ii ජ'නල් සටහන් යෙදවීමකින් තොරව රු.9,991,399 ක අත්තිකාරම් පියවීම් ලෙජරයේ සටහන් කර තිබීම.

iii අධිකාරියේ ගණුදෙනු සටහන් කිරීමේදී රු.391,914,146 ක් වටිනා ජ'නල් සටහන් 107 ක් තබා තිබූ නමුත් ඒ සඳහා නිසි අනුමැතියක් ලබා ගෙන නොතිබූ අතර, ජ'නල් වවුචර් පිළියෙළ කර නොතිබුණි.

(ආ) දීර්ඝකාලයක් තිස්සේ ලැබිය යුතු පුනරාවර්තන ප්‍රදාන ලෙස දැක්වූ රු.3,541,000 ක් අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ දී පූර්ව වර්ෂ ගැලපීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේ වුවද මෙම කපා හැරීම සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

### 2.2.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

සමාලෝචිත වර්ෂය අවසානයේ තිබූ රු. 184,900 ක තොගයේ නිරවද්‍යතාවය තහවුරු කිරීමට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

3

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | නිලධාරීන් හතර දෙනෙකුගෙන් රු.16,805ක උපයන විට ගෙවීම් බද්ද අයකර දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) II වන පරිච්ඡේදයේ 10 වන වගන්තිය | නියැදි පරීක්ෂාවේදී නිලධාරීන් අටදෙනෙකු පොදු 169 වෛද්‍ය පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) IV වන පරිච්ඡේදයේ 2.3 වන වගන්තිය | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංකය හා දායක මුදල් ගෙවීම ආරම්භ කළ දිනය පෞද්ගලික ලිපිගොනුවල දක්වා නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| (i) මුදල් රෙගුලාසි 165 (2) | චෙක්පත් හා මුදල් ලැබීම් මුදල් ඇණවුම් ලේඛනයක සටහන් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 184 | වටිනාකම රු.5,326,984ක මුදල් ලැබීම් සඳහා කුවිතාන්සි නිකුත් කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 267 | අධිකාරිය විසින් වැටුප් හා වේතන ගෙවීමේදී ආදායකයාගේ අත්සන හෝ කුවිතාන්සියක් ලබාගෙන නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 323 (1) | රජයේ මුදල් පෞද්ගලික ගිණුම් වල තැන්පත් නොකළ යුතු වුවත් එකතුව රු.521,300 ක තත්කාර්යය අත්තිකාරම් මුදල් පෞද්ගලික ගිණුම් 12ක තැන්පත් කර තිබුණි. |

4

| | |
|---|---|
| (v) මුදල් රෙගුලාසි 1 (2) (ඇ) | 2012 වර්ෂයේදී දෙන ලද රු.2,279,733 ක අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 371 (2) (ඇ) | නිලධාරියෙකුට වරකට ලබාගත හැකි අත්තිකාරම් මුදල රු. 20,000 සීමාව රු.100,000 දක්වා වැඩි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද, ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබූ අතර රු.100,000 ද ඉක්මවා අවස්ථා 03කදී එකතුව රු. 364,320ක අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි. |
| (vii) මුදල් රෙගුලාසි 1646 | වාහන 07 සම්බන්ධයෙන් ලොග් පොත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර ශේෂ කර නොතිබුණි. |
| (ඉ) 2003 ජූනි 02 දිනැති අංක් පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6.5.1ඡේදය | මුල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ගිණුම්වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.1,460,932 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව පෙර වර්ෂය සඳහා ඌනතාවය රු.11,428,602 ක් වූයෙන් එය පෙර වර්ෂය හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,967,670 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මහා භාණ්ඩාගාරයෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන රු. 16,210,000 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන හේතුව විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම් වල වටිනාකම රු. 114,474,350 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ශුද්ධ වත්කම් වූ රු.112,277,411 හා සැසඳීමේදී රු.2,196,939 ක් හෙවත් සියයට 1.9 ක වැඩිවීමකි. සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.12,610,651 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය වූ රු.15,548,563 හා සැසඳීමේදී රු.2,937,912 ක් හෙවත් සියයට 18 ක අඩුවීමකි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තාව අනුව පහත සඳහන් වැඩසටහන් සම්බන්ධයෙන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවී නොතිබුණි.

i. අධිකාරියේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධන වැඩසටහන් 05ක් පැවැත්වීමට රු.මිලියන 0.80 ක් වෙන්කර තිබුණද රු.මිලියන 0.42 ක් වැයකර වැඩසටහන් 03 ක් පමණක් පවත්වා තිබුණි.

ii. ප්‍රදර්ශන හා ජංගම සේවා වැඩසටහන් 80 ක් සඳහා වෙන්කරන ලද රු.මිලියන 1 න් රු. මිලියන 0.93 ක් වැය කර වැඩසටහන් 20 ක් පමණක් පවත්වා තිබුණි.

iii ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන 02 ක් පිහිටුවීමට රු.මිලියන 02 ක් වෙන්කර තිබුණද එවැනි මධ්‍යස්ථාන පිහිටුවා නොතිබුණි.

6

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරිය වෙත පැමිණිලි 23,767 ක් ලැබී තිබූ අතර ඉන් පැමිණිලි 8,130ක් විසඳා තිබූ නමුත් නොවිසඳා ඉදිරියට ගෙන ගිය ලද පැමිණිලි සංඛ්‍යාව 15,637ක් විය. අධිකාරිය වෙත වසරක් පාසා ඉදිරිපත් කෙරෙන පැමිණිලි වලින් ඉතා සීමිත ප්‍රමාණයක් එම වර්ෂය තුල විසඳීම හේතුවෙන් නොවිසඳී ඇති පැමිණිලි සංඛ්‍යාවේ සීඝ්‍ර වර්ධනයක් වන බව පෙන්නුම් කෙරෙන අතර වාර්ෂිකව අධිකාරියට ලැබෙන පැමිණිලි විසඳීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම කෙරෙහි කළමනාකරණය අවධානය යොමු නොකිරීම තුලින් මෙවැනි තත්ත්වයක් උද්ගතවී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද පර්යේෂණ හා අධ්‍යාපන කටයුතු සඳහා රු.මිලියන 4.8ක් වෙන්කර තිබූ අතර ඉන් රු. මිලියන 3.45 වැයකර පර්යේෂණ 03ක් පවත්වා වාර්තා ලබාගෙන තිබූ නමුත් එම වාර්තා අධිකාරියේ ඉදිරි කටයුතු සඳහා උපයෝගී කර ගෙන නොතිබුණි.

4.2 <u>ව්‍යාපෘති කළමනාකරණ දුර්වලතා</u>

අධිකාරියේ ව්‍යාපෘති 09 ක් සඳහා ඉකුත් වර්ෂවලදී ලද මුදල් අදාල කාර්යයන් සඳහා වැය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකතුව රු.11,638,386 ක් ඉතිරිව පැවති බැවින් ව්‍යාපෘති කළමනාකරණය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

4.3 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) ලැබිය යුතු පුනරාවර්තන ප්‍රදාන ගිණුමේ තිබූ රු. 3,541,000 ක ශේෂය කිසිදු සොයා බැලීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අතිරික්තා ඌණතා ගිණුමට හර කර කපා හැර තිබුණි.

(ආ) වාහන අනතුර නිසා වර්ෂය තුළ දැරීමට සිදුවූ අලුත්වැඩියා වියදම වූ රු. 1,113,736 න් රක්ෂණ ආයතනය ප්‍රතිපූරණය කරන ලද මුදල රු. 834,912 ක් වීමෙන් වෙනස වූ රු. 278,824 ක මුදල වගකිව යුතු පුද්ගලයෙකුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

7

4.4 හඳුනා ගන්නා ලද පාඩු

නිලධාරින් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීමේදී සිදුවූ දෝෂයක් හේතුවෙන් එය දෙවරක් පලකිරීමට සිදුවීම නිසා රු.29,568 ක පාඩුවක් වී තිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 510 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 331 ක් වූ අතර 179 ක පුරප්පාඩු පැවතුණි.

(ආ) මු.රෙ 453(ඌ) ඡේදයට අනුව සම්පූර්ණ සේවක සංඛ්‍යාව පාලනය පිළිබඳ වාර්තා ආයතන අංශයෙහි නිවැරදිව පවත්වා ගත යුතු වුවත් ආයතන අංශය ඉදිරිපත් කළ 2013 වර්ෂයේ මාසික කාර්ය මණ්ඩල තොරතුරු සමඟ ගිණුම් අංශයේ තථ්‍ය වශයෙන් වැටුප් ගෙවූ නිලධාරීන් සංඛ්‍යාව සමාන විය යුතු වුවත් එසේ සමාන නොවිය.

4.6 වාහන පරිපාලනය

සමාලෝචිත වර්ෂයේදී වාහන 03 ක් අනතුරුවලට ලක්වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මු.රෙ.104 (1), (3), (4) පරිදි වාහන අනතුරු සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ පවත්වා ප්‍රාරම්භක වාර්තා, පූර්ණ වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ආ) මු.රෙ 110 ප්‍රකාරව හානි ලේඛනයක් නඩත්තු කළ යුතු අතර එකී අනතුර/හානි පිළිබඳ විස්තර එහි ඇතුලත් කළ යුතු වුවත් අධිකාරිය විසින් මේ දක්වා සිදු වූ අනතුරු සම්බන්ධයෙන් හා සමාලෝචිත වර්ෂයේ සිදුවී තිබූ අනතුරු 03 සම්බන්ධයෙන් මු.රෙ.110 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව අධිකාරිය විසින් ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 12ක් ප්‍රමාද වී 2015 අප්‍රේල් 01 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

8

5.2 **සංයුක්ත සැලැස්ම**

අධිකාරියේ කාර්යභාරය සම්බන්ධව වර්ෂ 2012-2017 දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්මේ අඩංගු එක් එක් වැඩසටහනේ ප්‍රතිලාභ ළඟා කර ගැනීමේ ඉලක්ක වෙනුවෙන් නිශ්චිත කාල වකවානු හඳුනාගෙන නොතිබූ බැවින් ක්‍රියාකාරී සැලැස්ම හා සැසඳීමට නොහැකි විය.

5.3 **නොවිසඳී ඇති විගණන ඡේද**

පසුගිය වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

(අ) ව්‍යාපෘති දෙකක් යටතේ පැවති රු.2,510,672 ක් වටිනා සියයට සීයක්ම ක්ෂය කර තිබූ භාවිතයේ පවතින වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගතකර කිරීම.

(ආ) අධිකාරියේ නිලධාරීන්ට ලබාදුන් අත්තිකාරම් මුදල් පියවීම සඳහා දීර්ඝ කාලයක ප්‍රමාදවීම් පැවතීම හා ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම.

(ඇ) ගිණුම් පොත් පවත්වා ගෙන යෑමේ පවතින දුර්වලතා නිවැරදි කර ගැනීම.

6. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) මූල්‍ය පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) අත්තිකාරම් පියවීම

(ඈ) වත්කම් කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩ බලන)

෧

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

## தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை

இல. 330, தலவத்துக் கொட வீதி, மாதிவெல, ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டை.

## National Child Protection Authority

**No.330, Thalawathugoda Road, Madiwela, Sri Jayawadenapura, Kotte.**

දුරකථන / தொலைபேசி இல / **Telephone :** 0112778911-14

ෆැක්ස් / தொலைநகல் / **Fax :** 0112778915

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / **Email : ncpa@childprotection.gov.lk**

වෙබ් අඩවිය / இணையத்தளம் / **Web Site: www. childprotection.gov.lk**